# වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2011



ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

තැ.පෙ. 14, පේරාදෙණිය

**ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව**

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව
# 2011 වසර

**ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව**

**තැ.පෙ. 14, පේරාදෙණිය**


## අන්තර්ගතය


| | |
|---|---|
| කාර්ය සාධන පැතිකඩ | පිටුව 01 |
| හැඳින්වීම | පිටුව 03 |
| සාධන මට්ටම | පිටුව 06 |
| රාජකීය උද්භිද උද්‍යානය | පිටුව 12 |
| මල් වගා පර්යේෂණ සහ සංවර්ධන ඒකකය | පිටුව 19 |
| ජාතික ශාකාගාරය | පිටුව 31 |
| හක්ගල උද්භිද උද්‍යානය | පිටුව 39 |
| ගම්පහ උද්භිද උද්‍යානය | පිටුව 45 |
| ගනේවත්ත වන ඖෂධ උද්‍යානය | පිටුව 50 |
| හම්බන්තොට වියළි කලාපීය උද්භිද උද්‍යානය | පිටුව 53 |
| අවිස්සාවේල්ල තෙත් කලාපීය උද්භිද උද්‍යානය | පිටුව 57 |
| අතිගරු ජනාධිපතිතුමා සහ අගමැතිතුමාගේ නිළ නිවාස උද්‍යාන | පිටුව 61 |
| පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් ඒකකය | පිටුව 62 |
| ප්‍රකාශයට පත් කළ පර්යේෂණ පත්‍ර | පිටුව 63 |
| 2012 වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්ම | පිටුව 64 |

## කාර්ය සාධන පැතිකඩ


### 2011 වර්ෂයේ ආදායම

- ජාතික උද්භිද උද්‍යානවලට ඇතුල්වීමේ ගාස්තු, පැළ අලෙවිය, සහ අනෙකුත් ගාස්තු ආදියෙන් ලැබුණු සම්පූර්ණ ආදායම රු. මිලියන 353.4 කි. එය පෙර වසර (රු.මි. 179.6 ) හා සසඳා බැලිමේදී 96.7% කින් ඉහළ යාමකි.




### නරඹන්නන්ගේ පැමිණීම

- ජාතික උද්භිද උද්‍යාන ඉතිහාසය තුළ පළමු වතාවට වැඩිම නරඹන්නන් පිරිසක් වාර්තා කරමින් මිලියන 2 කට (2,098,985) වඩා නරඹන්නන් පිරිසක් මෙම වසරේදි උද්‍යානය නරඹා ඇත. 2011 වර්ෂය තුළ උද්භිද උද්‍යානය නැරඹූ විදේශ සංචාරකයන් ප්‍රමාණය (236,763) පෙර වසරට(210,949) වඩා 2011 වර්ෂය තුළ 12% ක් ඉහළ ගොස් ඇත.



## 2011 වර්ෂයේ මූළ වියදම

- ප්‍රධාන උද්භිද උද්‍යාන තුනේ (03) කාර්යයන් සැලසුම් කළ පරිදි මෙම වසර තුළදී ද ක්‍රියාත්මක වූ අතර, ප්‍රාග්ධන මූල්‍ය ප්‍රතිපාදන යටතේ නිම කරන ලද කාර්යයන් සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබීමට නියමිතව තිබූ මූල්‍ය ප්‍රතිපාදන ලැබීම් අවසාන මාස දෙක (02) තුළදී පමා විය.

| විස්තරය | ශුද්ධ ප්‍රතිපාදන (රු.මි) | මූළ වියදම (රු.මි) | ප්‍රතිපාදන ශේෂය (රු.මි) | % |
|---|---|---|---|---|
| **ප්‍රාග්ධන වැය** | 438.115 | 249.044 | 189.071 | **56.8** |
| **පුනරාවර්තන වැය** | 158.76 | 154.861 | 3.899 | **97.5** |

## විද්‍යාත්මක ක්‍රියාකාරකම්

- මෙම වසර තුල සැලසුම් කළ පරිදි විද්‍යාත්මක ක්‍රියාකාරකම් පුළුල් කරන ලදි.

| | |
|---|---|
| ක්‍රියාත්මක කරන ලද පර්යේෂණ වැඩසටහන් | 06 |
| ප්‍රකාශයට පත් කරන ලද පර්යේෂණ ලිපි | 13 |
| උද්භිද උද්‍යාන තුල පුද්ගලයන් පුහුණු වූ ගණන | |
| **ජෛව විවිධත්ව සංරක්ෂණය** | 562 |
| **ශාක සංරක්ෂණය** | 2,121 |
| **මල් වගාව** | 6,814 |
| **භූමි අලංකරණය** | 1,220 |
| **පැළෑටි වර්ගීකරණය සහ ශාකාගාර කළමනාකරණය** | 1,007 |
| උද්‍යානයේ පැළෑටි නිෂ්පාදනය | 235,164 |
| පැළෑටි අලෙවිය | 182,777 |
| වනෝද්‍යානයට අළුතින් ඇතුලත් කරන ලද ශාක ගණන | 126 |
| අනෙකුත් වැඩසටහන් | |
| **ජාතික රතු දත්ත නාමාවලී ව්‍යාපෘතිය** | 34,349 ඇතුළත් කිරීම්, 1,205 විශේෂ සහ 48 සපුෂ්ප ශාක කුල තක්සේරුවට ලක් කරන ලදී.<br>5,556 ඇතුළත් කිරීම්, 286 විශේෂ සහ 23 මීවන කුල තක්සේරුවට ලක් කරන ලදී. |

# හැදින්වීම

## පසුබිම

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, ශාක විතැන් සංරක්ෂණය හා ශ්‍රී ලංකාවේ උද්‍යාන අලංකරණ විද්‍යාව ප්‍රවර්ධනය සඳහා පර්යේෂණාත්මක හා තාක්ෂණික වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී මහඟු දායකත්වයක් ලබාදෙයි.

**දැක්ම**

ශ්‍රී ලංකාවේ විතැන් සංරක්ෂණයේ ප්‍රධාන මධ්‍යස්ථානය වෙමින් දේශීය ආර්ථික ප්‍රවර්ධනය උදෙසා උපරිම දායකත්වයක් ලබාදෙන අතර උද්භිද විද්‍යාත්මකව හා සෞන්දර්යාත්මකව වර්ෂ 2015 වන විට ලෝකයේ හොඳම නිවර්තන කලාපීය උද්භිද උද්‍යාන බවට පත්වීම.

මෙම දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන සියළු උද්භිද උද්‍යාන 19 වන ශතවර්ෂයේ මුල් භාගයේදී ආරම්භ වූ උද්‍යාන වේ. ප්‍රධාන උද්භිද උද්‍යාන වන පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය ද (1821), හක්ගල උද්භිද උද්‍යානය (1861), ගම්පහ හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය ද (1876) යන උද්භිද උද්‍යාන ආර්ථිකමය වශයෙන් වටිනාකමක් ඇති ශාක පිළිබද පර්යේෂණ සිදු කිරීමටත්, දිවයින තුළ ශාක සම්පත් පිළිබඳ ගවේෂණය කිරීමට බ්‍රිතාන්‍යයන් විසින් පිහිටුවන ලදි. මෙම ආයතන ශ්‍රී ලංකාවේ ආර්ථික මෙන්ම පාරිසරික සංවර්ධනය උදෙසා සියළුම ආකාරයේ ශාක හඳුන්වාගැනීම සඳහා වගකීමෙන් බැදී සිටි. මේ දක්වා ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල ලෙස ආර්ථිකමය හා බෝග වගාවන්ගේ දියුණුවක් ඇති වූ අතරම, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (1912) වනජීවි දෙපාර්තමේන්තුව (1887) මෙන්ම තේ, රබර් වැනි බෝග වගාවන්ගේ සංවර්ධනය සඳහා වූ ආයතනය ද බිහිවිය.

1912 වර්ෂයේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිහිටුවීමෙන් අනතුරුව උද්භිද උද්‍යාන ඒකී දෙපාර්තමේන්තුවේ අංශයක් ලෙස ක්‍රියාත්මක වූ අතර, 2006 වර්ෂයේදී ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදි. වර්තමානයේ එය ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ශාක සංරක්ෂණය හා පර්යේෂණ සඳහා පුරෝගාමී ආයතනයක් ලෙස ක්‍රියාත්මක වේ.

**මෙහෙවර**

ජනතාව සඳහා ශ්‍රී ලංකාවේ ස්වභාවික සහ නිර්මිත පරිසරයන්හි ඇති ශාක සම්පත් අධ්‍යයනය, තිරසාර සංරක්ෂණය සහ ආස්වාදය සඳහා අවස්ථාව ලබාදීම

අදවන විට මෙම උද්භිද උද්‍යාන ශාක පිළිබඳ එනම්, දකුණු ආසියාවට ආවේනික වූ සහ නිවර්තන ශාක සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමේදීත් ඒවා එක්රැස් කිරීමේදීත් ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් විශිෂ්ට ආයතන ලෙස හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකාවේ මෙම උද්භිද උද්‍යාන ලොව පුරා සුප්‍රසිද්ධ උද්‍යාන බවට පත් වී ඇති අතර, සෑම වසරකම මිලියන 1.8 ට වඩා පිරිසක් එම උද්‍යාන නැරඹීමට පැමිණ ඇත.

පේරාදෙණිය, ගම්පහ, හක්ගල යන ප්‍රධාන උද්භිද උද්‍යාන ත්‍රිත්වයට අමතරව, ශ්‍රී ලංකාවේ ඖෂධ පැළෑටි සංරක්ෂණය, තිරසාර භාවිතය හා කළමනාකරණය කිරීම සඳහා ගනේවත්ත වන ඖෂධ පැළෑටි උද්‍යානය 1950 දි ස්ථාපිත කරන ලද අතර, වියළි කලාපීය ශාක විතැන් සංරක්ෂණය සඳහා හම්බන්තොට වියළි කලාපීය උද්භිද උද්‍යානය ද තෙත් කලාපිය ශාක විතැන් සංරක්ෂණය සඳහා අවිස්සාවේල්ල උද්‍යානය ද ස්ථාපිත කරමින් පවති. මෙම උද්භිද උද්‍යාන ද්විත්වය 2012/2013 වර්ෂයේදී මහජනයා සඳහා විවෘත කිරීමට නියමිත ය.

## ක්‍රියාකාරකම්

- ශ්‍රී ලංකාවේ ශාක විවිධත්වය සංරක්ෂණය සඳහා විතැන් සංරක්ෂණ ක්‍රමවේද ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම හා ක්‍රියාවට නැංවීම.
- අධ්‍යාපන සහ සන්නිවේදන ක්‍රම උපයෝගී කර ගනිමින් ශ්‍රී ලංකාවේ ශාක සම්පත් පිළිබඳව හා ශාක සම්පත් බැඳි පවත්නා විවිධ වූ කර්මාන්ත සඳහා අවශ්‍ය වන්නාවූ නිවැරදි තොරතුරු හා ශිල්පීය ඥානය ලබාදීමට වැඩසටහන් ක්‍රියාවට නැංවීම.
- ශ්‍රී ලංකාවේ මල් වගා කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍යවන්නාවූ විවිධ පර්යේෂණ සහ තාක්ෂණ ක්‍රමවේද අත්හදා බැලීම සහ ක්‍රියාවට නැංවීම.
- ශ්‍රී ලංකාවේ ජාතික උද්භිද උද්‍යාන උසස් මට්ටමකින් පවත්වාගෙන යාම**.**
- සුදුසු ස්ථානවල නව උද්භිද උද්‍යාන පිහිටුවීම සඳහා අවශ්‍යවන්නාවූ සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාවට නැංවීම**.**
- උද්‍යාන අලංකරණ විද්‍යාව ශ්‍රී ලංකාවේ ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ සහ තාක්ෂණ වැඩසටහන් ක්‍රියාවට නැංවීම**.**
- ශ්‍රී ලංකාවේ හඳුනාගත් ඓතිහාසික වටිනාකමෙන් යුතු වෘක්ෂලතා සංරක්ෂණය කිරීම සඳහා තාක්ෂණික උපදෙස් ලබා දීම**.**
- අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ සෞඛ්‍ය ආරක්ෂාව යහපත්ව පවත්වාගෙන යාම .

**දෙපාර්තමේන්තු යටතේ ඇති ආයතන සහ ඒකක**

1. රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය.
2. හක්ගල උද්භිද උද්‍යානය, හක්ගල.
3. හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය , ගම්පහ.
4. ජාතික ශාකාගාරය, පේරාදෙණිය.
5. වන ඖෂධ උද්‍යානය, ගනේවත්ත.
6. මියැළි කලාපීය උද්භිද උද්‍යානය, මිරිජ්ජවිල, හම්බන්තොට.
7. සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය, ඉලුක්ඕවිට, අවිස්සාවේල්ල.
8. මල් වගා පර්යේෂණ හා සංවර්ධන ඒකකය, පේරාදෙණිය.
9. අධ්‍යාපන හා පුහුණු මධ්‍යස්ථානය, පේරාදෙණිය.
10. ජනාධිපති මැඳුර උද්‍යානය, කොළඹ.
11. ජනාධිපති මැඳුර උද්‍යානය, මහනුවර.
12. ජනාධිපති මැඳුර උද්‍යානය, නුවරඑළිය.
13. ජනාධිපති මැඳුර උද්‍යානය, අනුරාධපුරය.
14. අරලිය ගහ මැඳුර උද්‍යානය, කොළඹ.
15. අග්‍රාමාත්‍ය කාර්යාලීය උද්‍යානය, කොළඹ.
16. අග්‍රාමාත්‍ය නිළ නිවාස උද්‍යානය, නුවරඑළිය.
17. අග්‍රාමාත්‍ය නිළ නිවාස උද්‍යානය, විසුම්පාය.
18. සුවහස් මල් සෙවන, කොළඹ.
19. උද්‍යාන සහායක කාර්යාලය, නාරාහේන්පිට.
20. පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් ඒකකය, පිටකන්ද, මහනුවර.
21. පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් ඒකකය , බොරැල්ල.
22. පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් ඒකකය ජාවත්ත.
23. පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් ඒකකය නිලාවැලි, ත්‍රිකුණාමලය.
24. හරිත පියස පුහුණු මධ්‍යස්ථානය, මීගලෑව.

**කාර්ය මණ්ඩල තොරතුරු**

අනුමත සේවක සංඛ්‍යාව: 699

වත්මන් සේවක සංඛ්‍යාව: 659 (ස්ථිර: 429, සමෘද්ධි: 12, කොන්ත්‍රාත් පදනම : 230)

ස්ථිර කාර්ය මණ්ඩලය මාණ්ඩලික නිලධාරින් 17, තාක්ෂණික සේවයේ නිලධාරින් 34, කෘෂි මෙහෙයුම් උපාධිධාරි නිලධාරින් 03, උපාධිධාරි වැඩසටහන් සහකාර නිලධාරින් 22 හා කළමනාකරණ සහකාර සේවයේ නිලධාරින් 36 දෙනෙකුගෙන් සමන්විත වේ.

සේවක ආකෘතිය

| කාණ්ඩය | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය |
|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | 31 | 17 |
| **තෘතිය මට්ටම** | 58 | 33 |
| **ද්විතිය මට්ටම** | 95 | 72 |
| **ප්‍රාථමික මට්ටම** | 515 | 307 |
| ***සමෘද්ධි නිලධාරින්** | - | 12 |
| **කොන්ත්‍රාත් පදනම මත කම්කරුවන්** | - | 230 |
| එකතුව | **699** | **659** |

* සමෘද්ධි අධිකාරිය වෙතින් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව වෙත නිලධාරින් මාරු කිරිම අමාත්‍ය මණ්ඩල තීරණ අනුව සිදුවේ.

**කාර්ය මණ්ඩලය පුහුණු කිරිම හා ගොඩනැගිම**

| | විස්තරය | ආයතනය | රට | පුහුණුව ලැබු නිලධාරින් |
|---|---|---|---|---|
| 1 | සංවර්ධන වන රටවල් සඳහා මල් වගා තාක්ෂණය පිළිබඳ පුහුණු පාඨමාලාව | උපනිවර්තන මල් සඳහා වූ ෆුජිආන් TCDC ආයතනය | චීනය | පර්යේෂණ නිලධාරි, ගම්පහ |
| 2 | RUAF-FSTT නව්‍යකරණ ව්‍යාපෘතිය : කලාපිය ක්‍රමවත් කිරිමේ ව්‍යාපෘතිය | කැපිටල් හෝටලය - බැන්ගලෝරය | බැන්ගලෝරය - ඉන්දියාව | වැඩසටහන් සහකාර, ගම්පහ |
| 3 | කාර්යාල කළමනාකරණය | ශ්‍රම අධ්‍යයනය සඳහා වූ ජාතික ආයතනය | ශ්‍රී ලංකාව | කළමනාකරණ සහකාර නිලධාරින් 09 |
| 4 | ශ්‍රම ඵලදායිතාව නැංවිම සඳහා කාර්යාල කළමනාකරණය | ශ්‍රම අධ්‍යයනය සඳහා වූ ජාතික ආයතනය | ශ්‍රී ලංකාව | කළමනාකරණ සහකාර නිලධාරින් 08 |
| 5 | ශාක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය | වැගන්ගන් විශ්ව විද්‍යාලය | නෙදර්ලන්තය | වැඩසටහන් සහකාර නිලධාරි 02, මල්වගා පර්යේෂණ හා සංවර්ධන ඒකකය |


## කාර්ය සාධනය

### සංචාරකයින්

පේරාදෙණිය, හක්ගල සහ ගම්පහ උද්භිද උද්‍යාන නඩත්තුව ඉහළ මට්ටමකින් පවත්වාගෙන ගිය අතර, මෙම වර්ෂයේ 2,098,985 ක් (දේශිය සංචාරකයින් 1,862,222 හා විදේශිය සංචාරකයින් 236,763) උද්භිද උද්‍යාන නරඹා ඇති අතර, එය උද්භිද උද්‍යාන ඉතිහාසය තුළ මේ දක්වා වාර්තා වූ ඉහළම සංඛ්‍යාව ලෙස සැලකේ; එමෙන්ම 2011 වසර තුළ උද්භිද උද්‍යාන නැරඹූ විදේශිය සංචාරකයන් ප්‍රමාණය ( 236,763) පෙර වසර ( 210,949) හා සංසන්දනය කිරීමේදී 12% ක ඉහළ යාමකි.

| නරඹන්නන් කාණ්ඩය | පේරාදෙණිය | හක්ගල | ගම්පහ | එකතුව |
|---|---|---|---|---|
| **දේශිය වැඩිහිටි** | 895,028 | 354,522 | 163,134 | 1,412,684 |
| **දේශිය ළමුන්** | 271,999 | 137,986 | 21,998 | 431,983 |
| **ජ්‍යෙෂ්ඨ පුරවැසි** | 9,054 | 7,516 | 985 | 17,555 |
| එකතුව දේශිය නරඹන්නන් | **1,176,081** | **500,024** | **186,117** | **1,862,222** |
| **විදේශිය වැඩිහිටි** | 215,914 | 9,150 | 201 | 225,265 |
| **විදේශිය ළමුන්** | 7,310 | 712 | 5 | 8,027 |
| **විදේශිය සිසුන්** | 3,238 | 230 | 3 | 3,471 |
| එකතුව විදේශිය නරඹන්නන් | **226,462** | **10,092** | **209** | **236,763** |
| නරඹන්නන්ගේ මුළු එකතුව | **1,402,543** | **510,116** | **186,326** | **2,098,985** |


ආදායම




ආදායම


උද්‍යානවලට ඇතුළුවීමේ ගාස්තු, පැළ අලෙවිය, කුළී ආදියෙන් ලැබූ මුළු ආදායම රු.මිලියන 353.4 කි; එය පෙර වසරේ ආදායම (රු.මි. 179.6 ) හා සැසඳීමේදී 96.7% ක ඉහළ යාමකි. උද්‍යානය නැරඹුවන්ගෙන් ලැබූ මුළු ආදායම රු.මි. 329 වූ අතර, අනෙකුත් මූලාශ්‍රයන් (පැළ අලෙවිය, කුළි ආදිය) රු.මි. 24.4 උපයන ලදී.

| ඒකකය | මුළු ආදායම ( රු.) |
|---|---|
| රාජකීය උද්භිද උද්‍යානය , පේරාදෙණිය | 302,944,728.04 |
| උද්භිද  උද්‍යානය, හක්ගල | 34,513,127.39 |
| උද්භිද උද්‍යානය, ගම්පහ | 13,231,414.00 |
| වන ඖෂධ උද්‍යානය, ගනේවත්ත | 705,204.00 |
| වියළි කලාපිය උද්භිද උද්‍යානය , හම්බන්තොට | 9,750.00 |
| "සුවහස් මල් සෙවන" පැළ තවාන, බත්තරමුල්ල | 1,529,041.00 |
| තෙත් කලාපිය උද්භිද උද්‍යානය, අවිස්සාවේල්ල | 473,700.00 |
| **මුළු එකතුව** | **353,406,964.43** |



**ජාතික උද්භිද උද්‍යානවල නිෂ්පාදනය කරන ලද පැළවලින් විකුණන ලද පැළ ගණන සහ ඉන් ලබාගත් ආදායම**



## 1.3 රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම පිළිබඳ තොරතුරු

**අංකය: 32201**

| | වැය (රුපියල්) උපරිම සීමාව | අය (රුපියල්) අවම සීමාව | හර ශේෂය (රුපියල්) උපරිම සීමාව |
|---|---|---|---|
| අයවැය ඇස්තමේන්තුව - 2011 | **15,700,000.00** | **8,300,000.00** | **57,000,000.00** |
| ප්‍රතිශෝධිත සීමාව | - | - | - |
| සත්‍ය දත්ත | **14,421,276.00** | **10,181,512.00** | **46,032,508.00** |

වැය

ප්‍රාග්ධන වැය

| උප ව්‍යාපෘති | වැය විෂය | අයිතමය විස්තර | 2011 වර්ෂයේ අය-වැයෙහි ශුද්ධ ප්‍රතිපාදනය රු. (000) | මුළු වැය රු. (000) | ඉතිරි ප්‍රතිපාදන රු. (000) | % |
|---|---|---|---|---|---|---|
| | | **මූලධන වත්කම් වල පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම** | | | | |
| 0 | 2001 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 2,0000 | 1,981.510 | 18.490 | 99 |
| 0 | 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 300 | 228.640 | 71.360 | 76 |
| 0 | 2003 | වාහන | 450 | 434.473 | 15.527 | 97 |
| | | **ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම** | | | | |
| 0 | 2101 | වාහන | 12,000 | 11,438.450 | 561.550 | 95 |
| 0 | 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ | 450 | 442.207 | 7.793 | 98 |
| 0 | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 315 | 312.053 | 2.947 | 99 |
| 0 | 2104 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1,000 | 866.545 | 133.455 | 87 |
| 0 | 2105 | ඉඩම් හා ඉඩම් වැඩි දියුණු කිරිම | 1,500 | 985.199 | 514.801 | 66 |
| | | **ප්‍රාග්ධන මාරු කිරීම්** | | | | |
| 0 | 2201 | උද්භිද උද්‍යාන භාරකාර අරමුදල | 40,000 | 40,000 | 0.00 | 100 |
| 0 | 2401 | පුහුණුව සහ ගොඩනැගිමේ ධාරිතාවය | 100 | 98.655 | 1.345 | 99 |
| | | **විශේෂ ව්‍යාපෘති** | | | | |
| 1 | 2502 | ගනේවත්ත වන ඖෂධ උද්‍යානය සහ ගම්පහ උද්‍යානය සංවර්ධනය | 30,000 | 22,946.207 | 7,053.793 | 77 |
| 1 | 2502 | මල්වගා සංවර්ධන වැඩසටහන | 40,000 | 28,928.897 | 11,071.103 | 72 |
| 2 | 2502 | වියළි කලාපිය උද්භිද උද්‍යානය, හම්බන්තොට | 170,000 | 65,913.671 | 104,086.329 | 39 |
| 3 | 2502 | තෙත් කලාපිය උද්භිද උද්‍යානය, අවිස්සාවේල්ල | 40,000 | 19,303.089 | 20,696.911 | 48 |
| 4 | 2502 | මල්වගා ප්‍රවර්ධන වැඩසටහන | 100,000 | 55,164.648 | 44,835.352 | 55 |
| | | එකතුව | **438,115** | **249,044.244** | **189,070.756** | **57** |

**පුනරාවර්තන වැය**

| උප ව්‍යාපෘති | අයිතමය විස්තර | 2011 වර්ෂයේ අය-වැයෙහි ශුද්ධ ප්‍රතිපාදනය | මුළු වැය රු. (000) | ඉතිරි ප්‍රතිපාදන රු. (000) | % |
|---|---|---|---|---|---|
| | **පුද්ගල පඩිනඩි** | | | | |
| 1001 | වැටුප් සහ වේතන | 83,000,000.00 | 80,460,829.00 | 2,539,171.00 | 96.9% |
| 2002 | අතිකාල සහ නිවාඩු සඳහා ගෙවීම | 4,800,000.00 | 4,432,177.00 | 367,823.00 | 92.3% |
| 1003 | අනෙකුත් දීමනා | 38,500,000.00 | 38,134,192.00 | 365,808.00 | 99.0% |
| | **ප්‍රවාහන වියදම්** | | | | |
| 1101 | දේශීය | 1,300,000.00 | 1,268,442.00 | 31,558.00 | 97.6% |
| 1102 | විදේශීය | 228,000.00 | 226,386.00 | 1,614.00 | 99.3% |
| | **සැපයුම්** | | | | |
| 1201 | ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 582,000.00 | 581,854.00 | 146.00 | 100.0% |
| 1202 | ඉන්ධන | 2,000,000.00 | 1,956,104.00 | 43,896.00 | 97.8% |
| 1203 | ආහාර සහ නිළ ඇඳුම් | 150,000.00 | 149,781.00 | 219.00 | 99.9% |
| 1205 | අනෙකුත් දෑ | 2,800,000.00 | 2,798,208.00 | 1,792.00 | 99.9% |
| | **නඩත්තු වැය** | | | | |
| 1301 | වාහන | 1,400,000.00 | 1,398,646.00 | 1,354.00 | 99.9% |
| 1302 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 500,000.00 | 430,218.00 | 69,782.00 | 86.0% |
| 1303 | ගොඩනැඟිලි සහ ඉදිකිරීම් | 400,000.00 | 399,933.00 | 67.00 | 100.0% |
| | **සේවාවන්** | | | | |
| 1401 | ප්‍රවාහන | 900,000.00 | 867,657.00 | 32,343.00 | 96.4% |
| 1402 | තැපැල් සහ විදුලි සංදේශ | 1,400,000.00 | 1,325,813.00 | 74,187.00 | 94.7% |
| 1403 | විදුලිය සහ ජලය | 3,400,000.00 | 3,072,975.00 | 327,025.00 | 90.4% |
| 1404 | කුළී සහ දේශීය බදු | 100,000.00 | 99,334.00 | 666.00 | 99.3% |
| 1405 | අනෙකුත් සේවාවන් | 16,500,000.00 | 16,461,148.00 | 38,852.00 | 99.8% |
| | **මාරු කිරීම්** | | | | |
| 1506 | දේපල ණය පොළිය | 800,000.00 | 797,096.00 | 2,904.00 | 99.6% |
| | එකතුව | **158,760,000.00** | **154,860,793.00** | **3,899,207.00** | **97.5%** |

# පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය

අශ්ව ලාඩමක හැඩයට වූ භූමි භාගයක පිහිටා ඇති පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය වටා ශ්‍රී ලංකාවේ දිගම ගඟ ලෙස සැළකෙන මහවැලි ගඟ ගලා බසි; මෙම උද්‍යානය මහනුවර නගරයේ සිට කිලෝමීටර් හය හමාරක් එපිට නිශ්චල කඳුකර ප්‍රදේශයේ පිහිටා ඇත. මෙහි මුළු වපසරිය අක්කර 147 (හෙක්ටයාර් 60 ක් පමණ) වන අතර, ශාක වර්ග 4,500 ක් පමණ පවතී.

එමෙන්ම මෙම උද්‍යානය ශ්‍රී ලංකාවේ ශාක විශේෂ විශාල ප්‍රමාණයක වාසස්ථානය ද වන්නේ ය. ඈතට විහිදෙන තණබිම් වල සශ්‍රීක ලෙස අපේ රටට ආවේණික විශාල වෘක්ෂ වැඩී ඇති අයුරු දැක ගත හැකි අතර, උද්‍යානයේ ස්ථාපිත ඕකිඩ් උද්‍යානයට නරඹන්නන්ගේ ද සුවිශේෂී අවධානය යොමුවේ. මෙම උයන 300 කට අධික වූ විවිධ වර්ගයේ අත්‍යලංකාර ඕකිඩ් මල් වලින් ගහන වේ. පාරම්පරික ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ යොදා ගනු ලබන ගස් වර්ග සහ පැළෑටි වර්ග, කුළු බඩු උයන තුළ දක්නට ලැබේ. මෙම උද්‍යානය සමීපයෙන් ගලා බස්නා මහවැලි නදිය එම උද්‍යානයේ විචිත්‍රවත් බව තවදුරටත් ඔප් නංවයි.












➤ රුක් උයන

➤ රාජකීය උද්භිද උද්‍යානයට මාසිකව නරඹන්නන්ගේ පැමිණීම

➤ පුෂ්ප උයන

➤ ජපන් උද්‍යානය

**නරඹන්නන්ගේ පැමිණීම**

මෙම වසර තුළ සංචාරකයන් 1,402,543 (දේශීය නරඹන්නන් 1,176,081 සහ විදේශීය සංචාරකයන් 226,462) උද්භිද උද්‍යානය නැරඹූ අතර, එය පෙර වසර හා සංසන්දනය කිරීමේදී 8.7% ක වැඩිවීමකි; එලෙසම, විදේශීය සංචාරකයන්ගේ පැමිණීම ද පෙර වසරට වඩා (200,468) 2011 වසරේදී 12.9% කින් ඉහළ ගොස් ඇත .

**ආදායම**

උද්භිද උද්‍යානය තුළ පිහිටා ඇති පැළ අලෙවි සැලේ ගෙවතු ශාක 32,176, ඇන්තූරියම් 2,873, ඕකිඩ් 6,676, විසිතුරු පත්‍ර ශාක 32,592, ඖෂධ පැළෑටි 565, බීජ පැකට් 1,477 සහ වියලන ලද මල්, උණ බට වලින් සැදු මල් පෝච්චි, කුළු බඩු, රෝපණ අමු ද්‍රව්‍ය හා අමු මල් අලෙවි කරන ලදී. එම අලෙවියෙන් රු 302,943,728.00 එම වසර තුළ උපයන ලද අතර, එය පහත පරිදි දැක්විය හැක; ඒ නම් නරඹන්නන්ගෙන් රු.මි. 290.7 පැළ අලෙවියෙන් රු.මි. 3.3, ප්‍රකාශන අලෙවියෙන් රු.මි. 0.2 , කුළී ආදායම ලෙස රු.මි. 8.7 සහ චිත්‍රපට තුළින් රු.මි. 0.1 ලෙසය .

**ශාක එකතුව වැඩි දියුණු කිරීම**

එලිමහන් ශාක 107,029 ක් නිෂ්පාදනය කරන ලද අතර, වඳවී යන හා වැදගත් යැයි සැලකිය හැකි ශාක වල බීජ (*Lodoicea maldivica* බීජ, ආදිය) උද්‍යානය තුළ රැස් කොට එහි ශාක එකතුව හා භූමි අලංකරණ කටයුතු වැඩිදියුණු කිරීම සඳහා යොදා ගනු ලැබු අතර, විතැන් සංරක්ෂණය ක්‍රම ද අනුගමනය කරන ලදී.

ශාක වර්ග 93 ක් සම්බන්ධයෙන් විද්‍යාත්මක දත්ත රැස් කරන ලද අතර, උද්‍යානයේ දැනට පවත්නා ශාක එකතුව පිළිබඳ දත්ත පද්ධතියක් සැකසීම සඳහා ඡායාරූප ගැනීම ද සිදු කරන ලදී.

ශාකාගාර නිදර්ශක පුවරු 94 ක් සකස් කරන ලද අතර, ශාකාගාර වර්ග 143 රැස්කොට උද්‍යානය තුළ දැනට පවත්නා ශාකාගාර එකතුව වැඩිදියුණු කිරීම සඳහා යොදා ගන්නා ලදී.

දුර්ලභ මෙන්ම වඳවීමේ තර්ජණයට ලක් වී තිබෙන ශාක රැස් කිරීම සඳහා විතැන් සංරක්ෂණ පියවර හා ක්ෂේත්‍ර නිරීක්ෂණ කටයුතු සිදු කරන ලදී. රාජකීය උද්භිද උද්‍යානයේ විතැන් සංරක්ෂණ එකතුව

වැඩි දියුණු කිරීමේ අරමුණෙන් ශ්‍රී ලංකාවට ආවේණික ශාක වර්ග රැස් කිරීම සඳහා ක්ෂේත්‍ර ගවේෂණ කිහිපයක් සිදු කරන ලදී. රිටිගල සිදු කරන ලද ක්ෂේත්‍ර ගවේෂණයේදී ශාක වර්ග 10 ක් හා ශාකාගාර නිදර්ශක 14 ක් රැස් කරන ලදී. සිංහරාජයේ සිදු කරන ලද ක්ෂේත්‍ර ගවේෂණයේදී ශාක 205 ක් (වර්ග 64) හා ශාකාගාර නිදර්ශක 52 ක් රැස් කරන ලදී. පිළිකුට්ටුව වනාන්තරයේදී සිදු කරන ලද අනෙක් ක්ෂේත්‍ර ගවේෂණයේදී ශාක වර්ග 05 ක් හා ශාකාගාර නිදර්ශක 13 ක් රැස් කරන ලදී.

පැළ 58 ක් රුක් උයනේ සිටුවන ලදී. මෙම එකතුවට නව දේශීය ශාක, දැනට උද්‍යානයේ තිබෙන දේශීය ශාක, නව ආගන්තුක ශාක මෙන්ම දැනට පවත්නා ආගන්තුක ශාක ද ඇතුලත් ය. උද්‍යානයේ පවතින ශාක එකතුව තවදුරටත් පුළුල් කිරීමේ අරමුණෙන් ශාක 217 ක් එම එකතුවට එක් කරන ලදී. ගස් 46 ක් සම්බන්ධයෙන් දිරා ගිය සහ බිඳී ගිය අතු ඉවත් කිරීම, ගස්වල කඳ කුහර සඳහා පිළියම් කිරීම. (*Markhamia hidebrandtii,Cupressus funebris, Bauhinia purpurea* (B-347), *Chrysophyllum roxburghii*, *Myristica fragrans* (N-249), *etc.)* සිදු කරන ලද අතර, ආගන්තුක ශාක 21 ක් (*Roystonia regia*, *Myristica fragrans* (N-233a)) උද්‍යානයෙන් ඉවත් කිරීමද, මැරුණු දේශීය ගසක් උද්‍යානයෙන් ඉවත් කිරීමද සිදු විය. විවිධ බෞද්ධ සිද්ධස්ථානයන්හි නායක ස්වාමීන්වහන්සේලා විසින් සිදු කරන ලද ඉල්ලීම් අනුව ඓතිහාසික මෙන්ම ආගමික වශයෙන් වැදගත් වූ ගස් 11 ක් සඳහා ප්‍රතිකාර කිරීම සඳහා උපදේශනාත්මක සේවා සිදු කරන ලද අතර එහිදී එවැනි ගස් 6 ක් සඳහා ප්‍රතිකාර සිදු කරන ලදී. ගස් සංරක්ෂණ කටයුතු 13 ක් ද සිදු කරන ලදී.

උද්‍යානයේ ශාක එකතුව වැඩිදියුණු කිරීම සඳහාත්, ශාක පිළිබඳ විද්‍යාත්මක හා අනෙකුත් ඒ හා සබැඳි තොරතුරු පිළිබඳ නරඹන්නන් දැනුවත් කිරීම සඳහාත් ශාක 1,077 ක් සඳහා ලේබල් සවි කරන ලදී. මීට අමතරව සිහිවටන වෘක්ෂ 10 ක ලේබල් නැවත අළුත් කිරීම සිදු කරන ලද අතර, අළුත් ලේබල් 71 ක් ද සවි කරන ලදී. ශාක වර්ග 15 ක් පිළිබඳ තොරතුරු රැගත් ලේබල් ( 20” x 14”) 36 ක් සකස් කොට මුද්‍රණය කරන ලදී.







▲ ශාක ලේබල් කිරීම
◄ ක්ෂේත්‍ර ගවේෂණ පැවැත්වීම
▼ අධ්‍යාපන වැඩසටහන් පවත්වාගෙන යාම

**තොරතුරු ව්‍යාප්ත කිරීම**

***පාඨමාලා***

උද්‍යානයට අයත් අධ්‍යාපන ආයතනයේ පහසුකම් වැඩිදියුණු කරන ලදි. මල් වගා ක්‍රම හා භූමි අලංකරණ පිළිබඳ වූ ත්‍රෛමාසික සහතික පත්‍ර පාඨමාලා තරුණ තරුණියන් 78 දෙනෙකු සඳහා පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ දී පවත්වන ලදී. පැළ තවාන් කළමනාකරණය , පැළ හඳුනා ගැනීම , ජෛව විවිධත්වය, ශාක සැත්කම්, මල් සැකසුම්, පසු අස්වනු තාක්ෂණය, උද්භිද උද්‍යාන භූමි අලංකරණය හා අනෙකුත් ඒ හා සම්බන්ධ ක්ෂේත්‍ර පිළිබඳ පුද්ගලයන් 4,852 දෙනෙකු පුහුණු කරන ලදී. මෙම පුහුණු කිරීම් සිදු කරන ලද්දේ දෑවුරුදු හා එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවලට අමතරව ය. එමෙන්ම නිලධාරින් 19 ක් සඳහා භූමි අලංකරණය පිළිබඳ ඔටෝ කැඩ් පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

දෙපාර්තමේන්තු නිලධාරින්ගේ විද්‍යාත්මක ක්‍රියාකාරකම් පිළිබඳ වූ ශක්‍යතාවය ගොඩනැංවීම සඳහා පැළෑටි හඳුනා ගැනීමේ වැඩමුළුවක් දින 5 ක් පුරා පැවැත්විණ.

ජෛව විවිධත්ව සංරක්ෂණය හා උද්භිද උද්‍යාන සම්බන්ධ වැදගත්කම පිළිබඳ වූ විශේෂිත දැනුවත් කිරීමේ වැඩසටහනක් මහනුවර පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 100 ක් සඳහා ලෝක ළමා දිනයේදී පවත්වන ලදී.

***දැනුවත් කිරීමේ ප්‍රකාශන***

ශ්‍රී ලංකාවට ආවේණික ශාක හා ශ්‍රී ලංකාවට ආගන්තුක ශාක පිළිබඳව අත් පත්‍රිකා 2 ක් සකස් කරන ලද අතර, ප්‍රකාශයට පත් කිරීමට සූදානම්ව පවති.

***පිරික්සුම් කටයුතු***

පහත සඳහන් ස්ථානවල භූමි අලංකරණ කටයුතු ඉහල දැමීම සඳහා අවශ්‍ය වන උපදෙස් ලබාදෙනු වස් පිරික්සුම් කටයුතු කරන ලදී.

- බෝවලතැන්න හා උකුවෙල ජල පෝෂක ප්‍රදේශ
- මාතලේ මුලික රෝහල
- ජාතික සැකසුම් මධ්‍යස්ථානය
- වික්ටෝරියා,රන්දෙනිගල, රන්ටැඹේ හා කොත්මලේ ජල පෝෂක ප්‍රදේශ

***උපදේශන වැඩසටහන්***

පිරික්සුම් කටයුතු වලට අමතරව , භූමි අලංකරණ කටයුතු පිළිබඳ උපදේශන වැඩමුළු කිහිපයක් පහත සඳහන් ලෙස පවත්වන ලදී.

- පල්ලේකැලේ හෝටල් පාසැල සඳහා.
- මහනුවර හා ත්‍රිකුණාමලය හමුදා පුහුණු පාසැල
- නිල්ලඹ සමෘද්ධි අධිකාරියේ නිලධාරින් සඳහා
- මහනුවර නගර සභා කාර්යාලය සඳහා
- අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සඳහා
- ගාල්ල වරායේ නිලධාරින් සඳහා වෘක්ෂ නඩත්තු කිරීම

මහනුවර මහ රෝහල හා ත්‍රිකුණාමලයේ නැගෙනහිර පළාත් කාර්යාලය සඳහා භූමි අලංකරණ සැලසුම් ද සකස් කරන ලදී.

හම්බන්තොට උද්භිද උද්‍යානයේ භූමි අලංකරණ හා මල් වගා කිරීමේ කටයුතු






- ➢ නව වැසිකිළි පද්ධතිය
- ➢ වැඩි දියුණුවෙමින් පවතින මාර්ග ජාලය

වලදී රාජකීය උද්භිද උද්‍යානයේ නිලධාරීන් ඔවුන්ගේ විශේෂඥ දැනුම ලබාදෙන ලදී .

*ශාක හඳුනා ගැනීමේ වැඩසටහන*

ශාක හඳුනා ගැනීම සඳහා භාවිත කළ යුතු ප්‍රධාන සීමා පිළිබඳ සබරගමුව විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැනුවත් කරන ලදී. ශාක හඳුනා ගැනීම පිළිබඳ දේශන මාලාවක් ආයුර්වේද වෛද්‍ය නිලධාරීන් හා නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් සඳහා පවත්වන ලදී. ශාක හඳුනා ගැනීමේ කටයුතු ශ්‍රී ලංකා ක්ෂේත්‍ර උද්භිද විද්‍යාඥයින්ගේ සංවිධානයේ නිලධාරීන් 20 ක් සඳහා උණ ගස් හඳුනා ගැනීමේ වැඩසටහනක් පවත්වන ලදී.

රටවල් 40 ක ධීවර කර්මාන්තය හා සම්බන්ධ අමාත්‍යවරුන් හා ස්විට්සර්ලන්ත මහාචාර්යවරුන් දෙදෙනකු සඳහා ශාක හඳුනා ගැනීම පිළිබඳ මඟපෙන්වීම් ලබාදෙන ලදී.

**සංවර්ධන ක්‍රියාකාරකම්**

මහජන පොදු පහසුකම් වර්ධනය කිරීමේ අරමුණෙන් නවීන වැසිකිළි සංකීර්ණ 04 ක් ස්ථාපිත කරන ලදී. වැසිකිළි පවිත්‍රතා කටයුතු පෞද්ගලික පවිත්‍රතා සේවාවකට බාරදෙන ලද අතර කාර්යක්ෂම සේවාවන් සැපයීමේ අරමුණෙන් ලීටර් 2000 ක ධාරිතාවයෙන් යුත් ජල ටැංකි 2 ක් ස්ථාපිත කරන ලදී. උද්‍යානය තුළ භූමි අලංකරණ කටයුතු ඔප් නැංවීමේ අරමුණෙන් අභ්‍යන්තර මාර්ග පද්ධතිය පිළිසකර කරන ලදී. සිහිවටන තිළිණ විකිණීම සඳහා නව අලෙවි සැලක් හා ආබාධිත පුද්ගලයන්ට පහසුවෙන් ඇතුළු විය හැකි ලෙස සැකසුනු නවීන අංගෝපාංග සහිත නව ප්‍රවේශපත්‍ර කවුළුවක් ද ඉදිවෙමින් පවතී. (මේ වන විට එහි ඉදිකිරීම් කටයුතු 75% ක් පමණ නිම වී ඇත)

උද්‍යානයේ දකුණු කොටසේ නව ක්ෂේත්‍ර කාර්යාලයක් ස්ථාපිත කොට ඇත. ගිම්හාන කුටි, වැසිකිළි, නිළ නිවසේ හා අනෙකුත් අංගෝපාංග පිළිසකර කිරීම් කටයුතු සිදු කොට ඇත. උද්‍යානයේ භූමි කටයුතු කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම සඳහා නව යන්ත්‍ර, උපකරණ හා උද්‍යාන උපකරණ මිලදී ගන්නා ලදී.

**විශේෂ නියෝජිතයන්ගේ පැමිණීම**

විශේෂ නියෝජිත පිරිසක් උද්‍යානය නරඹන ලද අතර එහිදී උද්‍යාන නඩත්තුව හා භූමි අලංකරණ අංග පිළිබඳව ප්‍රසාදය පළ විය; මාලදිවයින් නිවාස, ප්‍රවාහක සහ පරිසර අමාත්‍යවරයා හා නියෝජ්‍ය ඇමතිවරයා වන මොහොමඩ් අස්ලම් මහතා සහ ශිෆාස් අලි මහතා, ලාඕසයේ කැබිනට් අමාත්‍යවරයකු හා සාමාජිකයින් තුන් දෙනෙකු; බංගලාදේශය, ඉන්දියාව, මාලදිවයින හා පකිස්තානයෙන් නියෝජිතයන් 50 දෙනෙකු, බංගලාදේශ හමුදාවේ සේනාධිපති ජනරාල් හා ගුවන් හමුදා ප්‍රධානියා, පාකිස්තානු හමුදා ජනරාල්, ඇමෙරිකා එක්සත් ජනපදයේ පෙන්ටගනයේ ආරක්ෂක ප්‍රධානියා, ඊශ්‍රායල් කෘෂිකර්ම අමාත්‍ය හා නියෝජිත පිරිස; බහු සංස්කෘතික පාර්ලිමේන්තු මිතුරන්ගේ සම සභාපති ගරු මරියා වැම්රකිතෝ මිය ඇතුළු ඕස්ට්‍රේලියාවේ අමාත්‍යවරුන් 8 දෙනෙකු , චීන මල් සංවිධානයේ සභාපති ගියැන්ග් සෙහුයි මැතිණිය ප්‍රමුඛ කර ගත් චීන රජයේ වන පරිපාලන නියෝජිතයන් එකොලොස් දෙනෙකු, ඉන්දියාවේ කථිකාචාර්යවරයෙකු වන ආචාර්ය රාම ක්‍රිෂ්ණන්, ඉතාලියේ ෆ්ලොරන්ස් සරසවියේ මහාචාර්ය අන්තා බිලියා ආදීන් මෙම වසරේදී උද්‍යානය වෙත පැමිණ ඇත.










- ⮝ ප්‍රතිසංස්කරණය කරන ලද ලංකා පොකුණ
- ⮜ දැයට සෙවණ' වැඩසටහන යටතේ ගස් සිටුවමින්
- ➢ මල් වලින් පිරීඇති වැලකින් උද්‍යානය අලංකාර වී ඇති අයුරු
- ⮟" දැයට කිරුළ" ජාතික ප්‍රදර්ශනයේදී



**විශේෂ කටයුතු**

ලංකා පොකුණ පිළිසකර කිරීම සඳහා වැඩසටහන් සාර්ථක ලෙස සිදු කරන ලද අතර ජාතික මල වන *Nymphaea nouchali* (සාමාන්‍ය ව්‍යවහාරය: මානෙල්"). ශාකයක් ද එම පොකුණේ සිටුවන ලදී. 'දැයට සෙවණ' වැඩසටහන යටතේ 2011 නොවැම්බර් 15 වන දින පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේදී ශාක වර්ග 28 ක් රෝපණය කරන ලදී.

ඉංජිනේරුමය කටයුතු පිළිබඳ මධ්‍ය උපදේශක කාර්යාංශය සහයෝගයෙන් ලංකාවට ආවේණික මෙන්ම දුර්ලභ ශාකයක් වන (වඳවී ගෙන යන ශාකයක් ලෙස සැලකෙනා) දිය බෙරළිය *Shorea ovalifolia* (C-207) නැවත උද්‍යානයේ සිටුවන ලදී.

63 වන නිදහස් සැමරුමට සමගාමීව පවත්වන ලද බුත්තල, මොණරාගල " දැයට කිරුළ" ජාතික ප්‍රදර්ශනයේදී භූමි අලංකරණ කටයුතු පිළිබඳ මහජනයා වෙත උද්‍යානයේ නිලධාරින් විසින් උපදෙස් ලබාදෙන අතර, පැළෑටි

වවුනියාවේ පැවති "ගොවි සතිය" ප්‍රදර්ශනය සඳහා නිලධාරින් සහභාගි වූ අතර මල් වගාව පිළිබඳ උනන්දුවක් දක්වන්නන්හට ඒ පිළිබඳව තොරතුරු ලබාදෙනලදී.

**සේවක ආකෘතිය**

***2011 වර්ෂයේ ඒකකයේ පවතින තනතුරු පිළිබඳ තොරතුරු***

| | තත්ත්වය | පවතින තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| 1. | නියෝජ්‍ය අධ්‍යක්ෂ | 01 |
| 2. | සංරක්ෂක | 01 |
| 3. | විදුහල්පති | 01 |
| 4. | වැඩසටහන් සහකාර | 02 |
| 5. | කෘෂිකර්ම උපදේශක | 03 |
| 6. | කළමනාකරණ සහකාර | 05 |
| 7. | උද්‍යාන සහායක | 05 |
| 8. | ගාස්තු අයකිරීමේ සහාකාර | 08 |
| 9. | රියැදුරු | 01 |
| 10. | කංගානි | 03 |
| 11. | මුරකරු | 20 |
| 12. | සංචාරක බංගලාකරු | 01 |
| 13. | ලොරි පිරිසිදුකරන්නන් | 01 |
| 14. | තවාන්කරු | 02 |
| 15. | බද්ධකරු | 01 |
| 16. | ට්‍රැක්ටර් ක්‍රියාකරු | 02 |
| 17. | වඩුවැඩකරු | 01 |
| 18. | පෙදරේරු | 03 |
| 19. | ලේබල් ලියන්නන් | 02 |
| 20. | තෘණ කපන යන්ත්‍ර ක්‍රියාකරු | 06 |
| 21. | වෑල්ඩිංකරු | 01 |
| 22. | කම්මල්කරු | 01 |
| 23. | ගස් කපන්නන් | 03 |
| 24. | ගස් හෙලන්නන් | 01 |
| 25. | ස්ථිර කම්කරු | 65 |
| 26. | කොන්ත්‍රාත් කම්කරු | 37 |
| | **එකතුව** | **177** |

***ස්ථානමාරු***

2011 අප්‍රේල් 07 දින ආචාර්ය ඒ.එම්.ඒස්. අත්තනායක මිය ජාතික ශාකාගාරයෙන් පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය වෙත මාරුවීමක් ලබන ලදී.

2011 අගෝස්තු 23 තෘණ කපන යන්ත්‍ර ක්‍රියාකරු එන්.ජී.විපුලසේන මයා ගනේවත්ත වන ඖෂධ උද්‍යානයෙන් පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයට වෙත මාරුවීමක් ලබන ලදී.

***උසස්වීම්***

පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂධුරය දැරූ කේ.එන්. යාපා මයා අධ්‍යක්ෂ (පර්යේෂණ, තාක්ෂණ හා ප්‍රචාරණ) ධුරය වෙත උසස්වීමක් ලබන ලදී.

***විශ්‍රාම යාම්***

2011 ජනවාරි 20 ගාස්තු අයකිරීමේ සහකාර එච්.එම්.එස්.බී.හේරත් මයා, 2011 අප්‍රේල් 02 එස්.ආර්. ඩබ්.එම්.එච්. මැනිකේ මිය, 2011 දෙසැම්බර් 21 ආර්.එම්. ජයතිලක මයා විශ්‍රාම ගත්තා ලදී.

2011 ජුලි 02 මුරකරුවන් වූ ටී.ජී.ආර්. ධර්මතිලක මයා, 2011 සැප්තැම්බර් 10 වී.ඒ.ඩබ්. මෙන්ඩිස් මයා සහ 2011 ඔක්තෝම්බර් 28 බී.වීජේසිංහ මයා විශ්‍රාම ගත්තා ලදී.

2011 මැයි 25 කම්කරුවන් වූ කේ.ජී. නවරත්න මයා, 2011 නොවැම්බර් 29 එච්.ඒ. ජයතිලකබණ්ඩා මයා, 2011 දෙසැම්බර් 17 එස්.වික්‍රමසිංහ මයා විශ්‍රාම ගත්තා ලදී.

# මල්වගා පර්යේෂණ හා සංවර්ධන ඒකකය

මල්වගා පර්යේෂණ හා සංවර්ධන ඒකකය, මල් වගා ක්ෂේත්‍රය සම්බන්ධ පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම සඳහා පිහිටුවන ලදි; එමෙන්ම, මෙම ක්ෂේත්‍රයේ සංවර්ධන උදෙසා පුහුණු වැඩසටහන්, ක්ෂේත්‍ර උපදේශන සේවා දිස්ත්‍රික්ක මට්ටමෙන් මල් වැවීමේ සංවිධාන ස්ථාපිත කරමින් මෙම ක්ෂේත්‍රය සම්බන්ධ ආයෝජන අවස්ථා පිළිබඳ දැනුවත් කිරීම, ඒ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය උපකරණ හා ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය ලබාදීම තුලින් මෙම ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා දායක කර ගැනීම ද මෙම ඒකකය පිහිටුවීමේ අරමුණු අතර වේ.

ශ්‍රී ලංකාවේ මල් වගා ක්ෂේත්‍රය මෑත අතීතයේ දී ලාභදායි විනිමය ඉපැයීම් ලබාදෙන මාර්ගයක් ලෙස ඉදිරියට පැමිණ ඇත. එහෙයින් ආදායම් උත්පාදනය හා රැකියා සැපයීම සඳහා මෙම ක්ෂේත්‍රය තවදුරටත් සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ. මල්වගා ක්ෂේත්‍රයේ නියැලෙන්නන්හට ඔවුන්ගේ සැබෑ විභවයන් හඳුනාගනිමින් ඔවුන්ගේ අස්වනු, පරිසරය, ගම, නගරය, රට යන සියල්ලේම තිරසාර සංවර්ධනය තුළින් විශාල වශයෙන් ලාභ ලබා ගැනීම සඳහා මල්වගා පර්යේෂණ හා සංවර්ධන ඒකකය ඔවුන්ගේ සහයෝගය ලබාදෙයි.



**පර්යේෂණ පිළිබඳ විශේෂ අවස්ථා**

මෙරට මල් වගා ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පර්යේෂණ වැඩසටහන් දියත් කරන ලදි;

1. Bamboo වල ස්කන්ධ ප්‍රචාරණය සඳහා ක්ෂුද්‍ර මුල ලේඛය වර්ධනය කිරීම සඳහා අධ්‍යයනයක් පැවැත්වීම.
2. *Ohpiophogon japonicus* වර්ධනයෙහිලා BAP (Benzylamino purine) හි බලපෑම පිළිබඳ අත්හදා බැලීම් ප්‍රතිකරයක් කරන ලදී.
3. Cordyline red edge වලට පොහොර යෙදීමෙදී ප්‍රාථමික ඇගැයුම
4. "Determination of suitable substrate mix for Gerbera grown in pots" පිළිබඳ පර්යේෂණ අත්හදා බැලීම් ප්‍රතිකාරයක් කිරීම සහ නිගමනය කිරීම.
5. *Zamioculcas zamifolia*; වල වේගවත් ප්‍රචාරණ ක්‍රමවේදයක් වර්ධනයක කරන ලදී.
6. ආවේණික ශාකයක් වූ *Chirita moonii*: වල ක්ෂුද්‍ර ප්‍රචාරණය අධ්‍යයනය කිරීම.

**පොස්ටර්**

*Dracaena sanderiana* ඩ්‍රැසීනා සැන්ඩෙරිනා අගයක් එකතු කල නිෂ්පාදන - එම්. සී.වික්‍රමසිංහ





- *Ohpiophogon japonicas*
- Gerbera
- *Cordyline* red edge
- *Bambusa multiplex* හි ප්‍රචාරණය





**ශාක අභිජනනය**

වර්ණය, අස්වැන්න, තත්ත්වය, ධාරිතාව ආදි වූ හිතකර ලක්ෂණයන්ගෙන් යුක්ත නව බෝග වර්ග නිෂ්පාදනය කිරීම සඳහා විශේෂයෙන් දේශිය ශාක, ඕකිඩ් හා ඇන්තුරියම් සම්බන්ධ ශාක දෙමුහුන් කිරීමේ වැඩසටහන් දියත් කරන ලදී.

"ලේඩි ජේන්'' වර්ගයේ දෙමුහුන් ඇන්තුරියම් ශාක 16 ක් ප්‍රචාරණය

සඳහා තෝරා ගනු ලැබූ අතර, මල්වගා කරුවන් අතර, බෙදා හරින ලදී.

විවිධ ඕකිඩ් දෙමුහුන් ශාකවල බීජ කරල් 24 ක් රසායනාගාරය තුළ ප්‍රරෝහණය කරන ලදී.

***දේශිය ශාක***





⮝ *Chirita moonii* ⮟ *Zamioculcas zamifolia*

විවිධ දෙමුහුන් ශාකවල බීජ පැළ ඇතුළු සියළුම ශාක සම්බන්ධයෙන් සාමාන්‍ය නඩත්තු කටයුතු සිදු කරන ලදී. දේශිය වර්ධක ශාක ප්‍රචාරණය මෙසේය: *Impatiens henslowiana* 50 cuttings, *Knrickia walkeri* 20 cuttings, *Chirita* hybrid 50 cuttings and *Balsam sp.* 20 cuttings

**පැල නිෂ්පාදනය**

උසස් ගනයේ ගෘහස්ථ ශාක, ඇන්තූරියම්, ඕකිඩ්, හා ජර්බෙරා වැනි ශාක අලෙවිය හා ගෙවතු හා උද්‍යාන අලංකරණය සඳහා ලබාදීමේ අරමුනෙන් පැළ නිෂ්පාදන වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලද අතර, දේශිය ශාක අලෙවියේදී වටිනාකම එකතු කිරීමද සිදු කරන ලදී.

බීජ මාධ්‍ය යොදාගනිමින් බීජ පැළ 3,450 ක් ද මෙරික්ලෝන්ඩ් ඕකිඩ් 475, ඕකිඩ් පැළ සමුහ වශයෙන් ඇති පෝච්චි 508 ද, ඕකිඩ් ශාක 38,695 ක් ද නිෂ්පාදනය කරන ලදී. විසිතුරු ශාක 42,945 ක් ද ජර්බෙරා ශාක 940 ක් ද, ජලජ ශාක 50 ක් ද , නිෂ්පාදනය කොට උද්‍යාන වෙත ලබාදෙන ලදී.

එමෙන්ම ඇන්තූරියම් බීජ පැළෑටි 6,970 ක් ද, පටක රෝපිත ඇන්තූරියම් පැළ 5,130 ක් ද නිෂ්පාදනය කරන ලදී. වෙනත් වර්ගයේ පටක රෝපිත පැළ 540 ක් ද නිෂ්පාදනය කෙරිණ. මීට අමතරව පැළ 33,356 ක් උද්‍යානවල අලෙවිසැල් වෙත නිකුත් කරන ලදී.

***ජාතික උද්භිද උද්‍යානයේ මල්වගා සංවර්ධන වැඩටසටහන්***

***ගම්පහ උද්භිද උද්‍යානය***

ඇන්තූරියම් හා ඕකිඩ් (Dendrobium). ශාක ක්ෂුද්‍ර ප්‍රචාරණය සඳහා මාධ්‍යය හා අනුමාධ්‍යය නිෂ්පාදනය සිදු කරන ලදී. මීවන, ජර්බෙරා හා ජලජ ශාක සම්බන්ධයෙන් සාමාන්‍ය නඩත්තු කිරීම් සිදු කරන ලදී. රසායනාගාරයෙන් නිකුත් කරන ලද බීජ රෝපිත ඕකිඩ් පැළ සිටුවනු ලැබූ පෝච්චි 538 ක් සකසන ලද අතර ඉන් පෝච්චි 80 ක් හා 2" ප්‍රමාණයේ ඒකල පෝච්චි 58 ක් ද අලෙවි විය. ජර්බෙරා ශාක 249 හා මල් 45 ක් ද අලෙවි විය .

උද්භිද උද්‍යානවල ජෛව විවිධත්වය හා ක්‍රියාකාරකම් සම්බන්ධ අධ්‍යාපන වැඩසටහන් ගුරු භවතුන් 11 හා ශිෂ්‍ය ශිෂ්‍යාවන් 141 ක් සඳහා පැවත්විණ. ජර්බෙරා, ඇන්තූරියම්, ඕකිඩ් හා විසිතුරු පත්‍ර ශාක වගා කිරීම සඳහා පිළිවෙළින් පුද්ගලයන් 75,562,245 හා 389 ක් සඳහා පුහුණු කිරීම් සිදු කෙරිණ.

මෙම වසරේ පලමු භාගය තුල පැවති වියළි කාලගුණය හේතුවෙන් ගම්පහ උද්භිද උද්‍යානය තුළ ජර්බෙරා ගෘහයේ දැඩි මයිටා උවදුරක් පිළිබඳ වාර්තා විය.









පටක රෝපණයේ 3,450 ක බීජ පැළ මෙරික්ලෝන්ඩ් ඕකිඩ් 475, ඕකිඩ් පැළ සමූහ සහිත පෝච්චි 508, හා ඕකිඩ් ශාක 38,695 ද නිෂ්පාදනය කරන ලදී. එමෙන්ම විසිතුරු පත්‍ර ශාක 42,945 ද ජර්බෙරා ශාක 940, ජලජ ශාක 50 ක් ද නිෂ්පාදනය කොට උද්‍යානය වෙත ලබාදෙන ලදී.

එලෙසම ඇන්තූරිම් පැළෑටි 6,970 ක් ද පටක රෝපිත ඇන්තූරියම් පැළ 5,130 ක් ද නිෂ්පාදනය කරන ලදී.

**වියළි කලාපීය උද්භිද උද්‍යානය, හම්බන්තොට**

උද්භිද උද්‍යානයේ සියළු හරිතාගාර ඉදිකිරීම් කටයුතු නිම කර ඇති අතර,

තායිලන්තයෙන් ආනයනය කරන ලද ඕකිඩ් 3500 කට වැඩි ප්‍රමාණයක් මෙන්ම දේශීය වශයෙන් නිෂ්පාදිත පැළ ද පෝච්චිවල සිටුවන ලදී. එමෙන්ම ගෘහාශ්‍රිත විසිතුරු පැළ 500 ක් ද නැවත පෝච්චි වල සිටුවන ලද අතර, තවත් විසිතුරු පැළෑටි 170 ක් ශාක දඬු මඟින් ප්‍රචාරණය කරන ලදී.

ඇන්තූරියම් පැළ තවාන් කිරීම සඳහා තවාන් සැකසීම හා මල් වගා කටයුතු සඳහා වෙන් කළ ප්‍රදේශයේ භූමිය සැකසීම ද සිදු කරන ලදී. ඇන්තූරියම්, ඕකිඩ් හා විසිතුරු පත්‍ර ශාක වගාව සඳහා



වියළි කලාපීය උද්භිද උද්‍යානයේ පැළ ගෘහය ඉදිකිරීම



සැකසූ හරිතාගාරවල පැළ කිරීමේ කටයුතු හා ඉදිරි නඩත්තු කටයුතු සිදු කරන ලදී.

මෙම වසරේ අගභාගයේදී මිරිජ්ජවිල වියළි කලාපිය උද්භිද උද්‍යානයේ ඇන්තූරියම් ශාකය වෙත දැඩි බැක්ටීරියා අංගමාරයක් පැතිර ගිය බව වාර්තා වී ඇත.

**අධ්‍යාපන හා පුහුණු**

මල් වගාකරුවන් වෙත යාවත්කාලීන කරන ලද දැනුම ලබාදීමක් ඔවුනගේ තාක්ෂණික දැනුම හා අනෙකුත් කුසලතා ඉහළ නැංවීමත් අරමුණු කොට ගනිමින් ඇන්තූරියම්, ඕකිඩ්, රෝස, ජර්බෙරා හා ශාක දඩු වගා කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන් මෙන්ම වැඩමුළුද පවත්වන

ලදී.

ඕකිඩ් මල් වගාකරුවන් 1170, ඇන්තූරියම් මල් වගාකරුවන් 1875,විසිතුරු පත්‍රික ශාක වවන්නන් 1121 සඳහා ශාක දඩු හා විසිතුරු පත්‍රික ශාක පිළිබඳව ද මල්වගා කරුවන් 181 සඳහා ජර්බෙරා වගාව පිළිබඳව ද පටක රෝපණය පිළිබඳ පුද්ගලයන් 64 ක් සඳහා ද පුහුණු කිරීම් සිදු කරන ලදී. එමෙන්ම ඊට අදාල අනෙකුත් පුහුණු ද පහත සඳහන් ලෙස සිදු කරන ලදී. මල් වගාකරුවන් 20 ක් සඳහා ඕකිඩ් වගාව පිළිබඳ පුහුණු වැඩසටහන් කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ සහයෝගය ද ඇතිව මාතලේ “ග්‍රීනට් ප්ලාන්ට්ස්” පෞද්ගලික සමාගම් සංකීර්ණයේදී පැවැත්විණ.



වගාකරුවන් සඳහා වැඩමුළුවක් පැවැත්වීම

විසිතුරු පත්‍රික ශාක වගා කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන් මල්වගාකරුවන් 50 දෙනෙකු සඳහා ගුරුදෙනිය අධ්‍යාපන පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්වින.

රජරට විශ්ව විද්‍යාලයේ සිසු සිසුවියන් 20 ක් සඳහා ඇන්තූරියම්, ඕකිඩ්, හා විසිතුරු පත්‍රික ශාක පිළිබඳව ප්‍රායෝගික දේශනයක් පැවැත්විණ.

වයඹ පළාතේ මල් වගාකරුවන් 20 ක් සඳහා ශාක දඩු හා ඇන්තූරියම් සම්බන්ධ පූර්ව හා පසු අස්වනු පිළිබඳ දේශනයක් අපනයන සංවර්ධන මණ්ඩලයේ සංවිධානයෙන් පැවැත්විණ .

ක්ෂේත්‍රයට අනුගත කිරීමේ එක් අංගයක් ලෙස නවක පත්වීම් ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරින් 120 සඳහා “ දේශිය හා ජාත්‍යන්තර මල් වගා කර්මාන්තයේ වර්තමාන තත්ත්වය” පිළිබඳ දේශන මාලාවක් පැවැත්විණ.

විසිතුරු ශාක, ඕකිඩ් ආදිය වගා කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන් තුනක් පුද්ගලයන් 165 ක් සඳහා පේරාදෙණිය උද්භිද උද්‍යානයෙන් පිටත විවිධ ආයතන වල පැවැත්විණ.

කෘෂිකර්ම විද්‍යාලයේ සිසු සිසුවියන් 28 ක් සඳහා මල් පැළ වගාව පිළිබඳ දේශන මාලාවක් දෙමළ භාෂාවෙන් පැවැත්විණ.

ඇන්තූරියම් හා ඕකිඩ් වගාව පිළිබඳ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරින් 35 ක් සඳහා සේවාස්ථ පුහුණුවක් රත්නපුරයේදී පැවැත්විණ. මෙම ඇන්තූරියම්, ඕකිඩ්, හා ජර්බෙරා වගාව පිළිබඳ බස්නාහිර පළාතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරින් 25 ක් බෝඹුවෙල ISTI හිදි පුහුණු කෙරිණි. එමෙන්ම “ මල් වගාව සඳහා පටක රෝපණ තාක්ෂණය” පිළිබඳ පුහුණුවක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරින් 20 ක් සඳහා ගන්නෝරුව ISTI හිදි පැවැත්විණ.

ඕකිඩ්, ඇන්තූරියම් විසිතුරු පත්‍රි ශාක ජර්බෙරා වගා කිරීම සඳහා පොදුවේ කෘමි හා රෝග කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික පුහුණුවක් සිසුන් සඳහා රාජකීය උද්භිද උද්‍යානයේදි පැවැත්විණ. හක්ගල උද්භිද උද්‍යානයේදි ද ඕකිඩ්, විසිතුරු පත්‍රික ශාක, ඇන්තූරියම් හා

ජර්බෙරා පිළිබඳ පුහුණු වැඩමුළුවක් පුද්ගලයන් 40 ක් සඳහා සිදු කෙරිණ. ඕකිඩ් හා විසිතුරු පත්‍රික ශාක වගා කිරීම පිළිබඳ පුහුණු වැඩසටහනක් පුද්ගලයන් 30 ගේ සහභාගිත්වයෙන් නාලන්දා, දිස්තක් පුහුණු මධ්‍යස්ථානයේ දී පැවැත්විණ.

ඕකිඩ් පිළිබඳ පුවත්පත් ලිපි 18 ක් “ ලංකාදීප” හා සිරිකත පුවත්පත්වල පල කරනු ලැබි ය.

**ප්‍රකාශන**

නොමිලේ බෙදා හැරීම සඳහාත් අලෙවිය සඳහාත්, පිළිවෙළින් පුවත්පත් ලිපි 04 ක් එක් පිටපතකින් 4000ක් ලෙස ද අත් පත්‍රිකා 11 ක එක් පත්‍රිකාවකින් පිටපත් 1000 බැගින් ද පොත් සංස්කරණය කරන ලද අතර, නව තොරතුරු ඇතුළත් කොට යාවත්කාලීන කර නැවත මුද්‍රණය කරන ලදී.

වැදගත් ගනයේ ලා සැලකිය හැකි මල්වගා ක්ෂේත්‍රයේ විවිධ ගණයේ බෝග වර්ග 25 ක් සම්බන්ධ වගා කිරීමේ ක්‍රම පිළිබඳව දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් පුවත්පත් වල පල කරන ලද ලිපි ආශ්‍රයෙන් සැකසූ පොතක් ප්‍රකාශයට පත් කිරීම සඳහා සුදානම් කර ඇත.

**උපදේශනාත්මක සේවා**

වාණිජ මල් වගාව, තවාන් කළමනාකරණය, කෘමි හා රෝග කළමනාකරණය මෙන්ම ක්ෂුද්‍ර ප්‍රචාරණය යන කරුණු යන කරුනු පිළිබඳ උපදේශන සේවා පාසැල් සිසුන් ඇතුළු පුද්ගලයන් 615 දෙනෙකු හට නොමිලේ ලබා දී ඇත; එහිදී මෙම ඒකකය වෙත පැමිණ හෝ තැපැල් මාර්ගයෙන් තමාගේ ව්‍යාපෘති සිදුකරගෙන යාම සඳහා එම පාසැල් සිසුනට අවස්ථාව ලබාදෙන ලදී.




මල්වගා අංශයෙන් මුද්‍රිත අත් පත්‍රිකා හා මුද්‍රණය කරන ලද පුවත්පත් හසුන්

**ජාතික මල් වගා සංවර්ධන වැඩසටහන (“සුවහස් මල් ” වැඩසටහන)**



**“සුවහස් මල්” වැඩසටහන යටතේ කොළඹදී පවත්වන ලද ප්‍රදර්ශනයක්**

දිවයින තුළ මල්වගාව සංවර්ධනය කිරීමේ අරමුණු පෙරදැරිව 2005 වසරේදී “ සුවහස් මල්” වැඩසටහන දියත් කළ අතර, මල් වගා ක්ෂේත්‍රයේ නියැළි සුළු පරිමාණ හා මධ්‍ය පරිමාන

මල්වගාකරුවන් / තවාන් කරුවන් බලගැන්වීමත් ඔවුන්ගේ ආර්ථික තත්ත්වයන් ඉහළ දැමීමටත් මෙම වසරේදී ද එම වැඩසටහන් ක්‍රියාත්මක වේ .

පුත්තලම (06), මහනුවර (07), මාතලේ (08), ගම්පහ (27), කෑගල්ල(17), නුවරඑළිය (09), කළුතර, ඌව, හම්බන්තොට (05), බදුල්ල (6), කළුතර (6), බලන්ගොඩ (01), කුරුණෑගල (01), මොණරාගල (01) හා කොළඹ යන ප්‍රදේශවල මල්වගාකරුවන්ගේ උද්යෝගිමත් සහභාගිත්වයෙන් "සුවහස්මල් වගාකරුවන්ගේ සමාජ 97 ක් ක්‍රියාත්මක වේ.



"සුවහස් මල් " වැඩසටහන යටතේ වැවිලිකරුවන් විසින් පවත්වාගෙන යන පැළ තවානක්



වගාකරුවන් සඳහා දේශන පැවැත්වීම

මල්වගාකරුවන් 834 ක් සඳහා මල් වගාව පිළිබඳ තාක්ෂණික දැනුම ලබාදිම අරමුණු කොටගෙන ගම්පහ, මහනුවර, මාතලේ, පුත්තලම, කෑගල්ල, හම්බන්තොට, නුවරඑළිය දිස්ත්‍රික්කවල පැවැත්වූ ජාතික වැඩමුළු 24 දී මතු වු ක්ෂේත්‍රය ගැටළු සඳහා උපදෙස් ලබාදීමටත් මෙහෙයුම් කටයුතු සිදු කිරීමටත් මාසික රැස්වීම් 374 ක් හා ක්ෂේත්‍ර නිරීක්ෂණය 609 ක් සංවිධානය කරන ලදී.

මල්වගා ක්ෂේත්‍රයේ මල්වගාකරුවන්ගේ අලෙවිකරණ හැකියාව ඉහල දැමීම සඳහා සුළු පරිමාණ ප්‍රදර්ශන 83 ක් හා දිස්ත්‍රික්ක 14 පුරා මහ පරිමාණ ප්‍රදර්ශන පවත්වා ඇත.

සහනදායි මිල ගණන් යටතේ ( ජර්බෙරා 15,700, කානේෂන් 1000, ජිප්සෝෆිලා 1500 හා ඕකිඩ් පැළ 16,900) ඉතා උසස් තත්ත්වයේ මව් ශාක සපයමින් නුවරඑළිය හා බදුල්ල දිස්ත්‍රික්කවල මල්වගාකරුවන් හට නව වර්ගයේ ශාක හඳුන්වා දි ඇති අතර, ඒවා මල් වගා ක්ෂේත්‍රයට එක්කොට ඇත. වර්ග 100 කින් යුත් තුරු වියන් (අඩි 10 x 10) ප්‍රදර්ශන කටයුතු සඳහා මල්වගාකරුවන්ට ලබාදීම සඳහා මිලදී ගන්නා ලදී.

ගම්පහ කෑගල්ල හා හම්බන්තොට පළාත්වල "සුවහස් මල්" සමාජවල මල්වගාකරුවන් හට ක්ෂේත්‍රය පිළිබඳ ඉතා හොඳ දැනුමක් හා පලපුරුද්දක් ලබාදීම සඳහා විවිධ ස්ථානවල ඉතා හොඳින් පවත්වාගෙන යනු ලබන තවාන් නැරඹීමට ක්ෂේත්‍ර සංචාර සඳහා යොමු කරන ලදී.



“සුවහස් මල් “ වැඩසටහන යටතේ කොළඹ පැවති ප්‍රදර්ශනයක්

**සුවහස් මල් සෙවන පැළ තවාන් හා අලෙවි සැල**

දිවයිනේ විවිධ ප්‍රදේශවල “සුවහස්මල්” ගොවි සමාජවලට අයත් මල් වගාකරුවන්ගේ නිෂ්පාදන අලෙවි කිරීමත් මල් හා විසිතුරු පැළෑටි අලෙවි සැලක් ලෙස පවත්වාගෙන යාමත් අරමුණු කොට ගෙන 2006 වර්ෂයේදී කොළඹ ටොරින්ටන්හි මෙම සුවහස් මල් සෙවන ස්ථාපිත කරන ලදී.

කොළඹ නගරයේ සිදුකරන ලද ප්‍රතිසංස්කරණ කටයුතු හේතුවෙන් මෙම පැළ තවාන් හා අලෙවි සැල බත්තරමුල්ලේ පිහිටි ජනකලා කේන්ද්‍රයේ පරිශ්‍රයට මෙම වසරේදී ගෙන යන ලදී.

මෙම වසරේදී මෙම මධ්‍යස්ථානය ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය විකිණීම, උද්‍යාන ව්‍යාපෘති කොන්ත්‍රාත් භාර

ගැනිම හා මල් වගාකරුවන්ගේ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා ප්‍රදර්ශන හා පැළ අලෙවි සැල් සංවිධානය කිරීම යන කටයුතු වල නිරත විය. පැළ අලෙවි මධ්‍යස්ථානයේදී 22,046 ක් ද, කැපූ මල් 4000 ක් ද අලෙවි කරනු ලැබූ අතර රු.මි. 1.52 ක් උපයාගෙන ඇත.

ගම්පහ සහ කොළඹ “ සුවහස් මල් සමාජ” වල මල් වගාකරුවන්ගේ නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීමටත් අලෙවි කිරීමටත් කොළඹ ටොරින්ටන් පෙදෙසෙහිදි පැළ ප්‍රදර්ශනයන් හා අලෙවි සැලක් පෙබරවාරි මාසය පුරා පැවැත්විණ.
නුවරඑළිය, බදුල්ල “ සුවහස් මල්” සමාජවල මල්වගාකරුවන්ගේ කැපූ මල් මෙම ප්‍රදර්ශනයේදී අලෙවි කරනු ලැබීය.

**මල්වගා ප්‍රවර්ධන වැඩසටහන**

මල්වගා ක්ෂේත්‍රයේ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ලෙස කොළඹ, ගම්පහ සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල
කැපූ මල්, විසිතුරු පැළෑටි හා ඇන්තූරියම් වගාව ප්‍රවර්ධනය සම්බන්ධ විශේෂ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී.

කැපූ ශාක කැබලි වගා කිරීම සඳහා කෑගල්ල, ගම්පහ සහ කොළඹ දිස්ත්‍රික්ක වල විභව ආයෝජනයන්ගෙන් අයදුම්පත්‍ර කැඳවමින් පුවත්පත් දැන්වීම් සිංහලෙන් ඉංග්‍රීසියෙන් හා දෙමල භාෂාවෙන් පල කරන ලදී. එහිදි මෙම ව්‍යාපෘතිය සඳහා පියවර I හා II යටතේ තවාන් සංවර්ධනය උදෙසා 50:50 පදනම යටතේ රජයේ අනුග්‍රහය ද ලබා ගන්නා ලදී.
සියළු අයදුම්පත්‍ර ලේඛණගත කරන ලද අතර, අදාල ලේඛණගත කරන ලද තොරතුරු මඟින් ආයෝජනය හැකියාව මෙන්ම ඉඩම් තිබෙන බව (අක්කර ½ වඩා අඩු) තහවුරු කරගන්නා ලදී. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ගම්පහ, කෑගල්ල හා කොළඹ දිස්ත්‍රික්ක වලින් සියළු සුදුසුකම් සපුරනු ලැබූ මල්වගාකරුවන් 395 තෝරා ගන්නා ලදී.








- වගාකරුවන් සඳහා ජීඅයි බට බෙදා හැරීම
- වගාකරුවන් සඳහා රෝපණ ද්‍රව්‍ය ලබාදීම
- වගාකරුවන් සඳහා සෙවන දැල් බෙදා දීම
- වගාකරුවන් විසින් ඔවුන්ගේ ප්‍රවර්ධනය සඳහා තවාන්වල රෝපණ වැඩසටහන පවත්වාගෙන අයුරු

තෝරාගත් වවන්නන් සඳහා 2011 වර්ෂයේ මැයි 11 සහ නොවැම්බර් 23 දින පිළිවෙළින් අදියර I සහ II යටතේ අපනයනකරුවන්ගේ ද සහභාගිත්වයෙන් වැඩමුළු සමාරම්භක වැඩසටහන සඳහා සංවිධානය කරන ලදී. සියළුම සහභාගිවන්නන් සඳහා වැවිය හැකි බෝග වර්ග වගා ක්‍රමවේද මෙන්ම තාක්ෂණික තොරතුරු සපයන ලදී.

වර්තමානයේ කර්මාන්තයේ නියැලි සිටින අපනයනකරුවන්හට තෝරාගත් පුද්ගලයන් හඳුන්වා දෙන ලදී. වැඩමුළුවේදී ඩ්‍රසීනා සැන්ඩෙරීනා (*Dracaena sanderiana)* වගාව පිළිබඳව තොරතුරු ඇතුළත් අත්පත්‍රිකාවක් ද බෙදා හරින ලදී.



එක් එක් පුද්ගලයින් සඳහා අවශ්‍ය දෑ පිළිබඳව සාකච්ඡා කළ අතර වැඩසහන ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුන්හට අදහස්

ප්‍රකාශ කිරීම සඳහා අවස්ථාවක් ලබාදෙන ලදී.

රෝපණ ද්‍රව්‍යය සැපයීම සඳහා පුවත්පත් දැන්වීම් ද කැඳවා ඇත. [*Polyscias* වර්ගය, *Cordyline terminalis* වර්ගය, *Dracaena sanderiana* වික්ටරි සහ සුදු , Crotons වර්ග, *Dracaena purple compacta* (DPC canes)

*Chrysalidocarpus lutescense* (කේන් පාම්)] මෙන්ම සෙවන දැල් ( 60% -70% සෙවන ලබාදෙන) සහභාගිවන්නන් අතර, බෙදා හැරීම අවශ්‍ය වන අතර සිංහල, ඉංග්‍රීසි සහ දෙමල පුවත්පත්වල මිලදී ගැනීම පල කර අතර ව්‍යාපෘතියේ I අදියර යටතේ තෝරා ගත් වවන්නන් අතරේ බෙදා හරින ලදී.

II අදියර ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සියලුම ද්‍රව්‍යය (නිදසුන් වශයෙන් සෙවනදැල් සහ ජී අයි බට) මිලදී ගත් අතර 2012 වර්ෂයේ ප්‍රථම කාර්තුවේදී බෙදා දීමට නියමිත ය.
ව්‍යාපෘතිය හේතුවෙන්, අක්කර 140 කැපු පත්‍ර වගාව සඳහා එක් කළ අතර මිලියන විස්සක කැපු පත්‍ර මෙම ප්‍රදේශයේ නිෂ්පාදනය කරන ලදී.

**ගම්පහ දිස්ත්‍රික්කයේ තරුණියන්ගේ ස්වයං රැකියාව සවිබල ගැන්වීම සඳහා " ලිය අභිමන්" වැඩසටහන**

ගම්පහ දිස්ත්‍රික්කයේ මෙම වැඩසටහන යටතේ ඇන්තුරියම් වගාව මෙන්ම විසිතුරු පත්‍රික ශාක පිළිබඳව ස්වයං රැකියාවේ නියැලුණු 475 පුහුණු කර ඇත. සහභාගිවන්නන්ට අයත් තෝරා ගත් පැල තවාන් වල සංචාරය කළ අතර, ක්ෂේත්‍ර උපදෙස් සපයන ලදී.

ආසන්න වශයෙන් ඇන්තුරියම් පැළ 18,000 සහ විසිතුරු පත්‍රික ශාක 5000 මෙන් රෝල් 15 ක් ද සෙවන දැල් (සෙවනදැල් මුළු ප්‍රමාණය රෝල් 30 වේ) මෙම වැඩසටහන යටතේ තෝරාගත් වගාකරුවන් වෙත බෙදා හරින ලදී.

**මල් වගා පර්යේෂණ පිළිබඳ ජාතික සමුළුව**

මල්වගා පර්යේෂණ පිළිබඳ ජාතික සමුළුව පිළිවෙලින් 2010 සහ 2011 වර්ෂයේ ජනවාරි 25 දින සහ දෙසැම්බර් 16 දින ශ්‍රී ලංකා කෘෂිකර්ම පර්යේෂණ





➤ " ලිය අභිමන්" වැඩසටහන යටතේ ඇන්තුරියම් පැළ ස්වයං රැකියාවන්හි නියුතු කාන්තාවන් හට බෙදා දීම

ප්‍රතිපත්ති පිළිබඳ කවුන්සිලයේ සහයෝගීත්වයෙන් පවත්වන ලදී. 2008 සහ 2009 වර්ෂයේදී පැවැත්වූ සම්මේලන මුද්‍රිත වාර්තාවන් (පිටපත් 250) සමුළුවේදී මුද්‍රණය කර බෙදා හරින ලදී.

2010 වර්ෂයේ මල්වගා පර්යේෂණ පිළිබඳ ජාතික සමුළුවේදී පර්යේෂණ පත්‍ර 13 ක් ඉදිරිපත් කරන ලදී. 2011 වර්ෂයේ මල්වගා පර්යේෂණ පිළිබඳ ජාතික සමුළුවේදී මල් වගා කර්මාන්තය හා සම්බන්ධ පර්යේෂණ පත්‍ර 26 ක් සහ පෝස්ටර් 02 ක් විවිධ දෙපාර්තමේන්තුවලට අයත් නිලධාරින් සහ පුද්ගලික අංශයේ ආයතන මෙන්ම පේරාදෙණිය, ඌව වෙල්ලස්ස, රජරට සහ රුහුණු විශ්ව විද්‍යාලවලට අයත් සිසුන් විසින් ඉදිරිපත් කරන ලදී.

**සෙසු ක්‍රියාකාරකම්**

Dendrobium, Vanda, Cattley, Epdendrum සහ Tolumnia බීජ ශාක තායිලන්තයෙන් (පේරාදෙනිය, ගම්පහ, අවිස්සාවේල්ල සහ හම්බන්තොට) දෙපාර්තමේන්තුවේ සියළුම උද්භිද උද්‍යාන වෙත ආනයනය කරන ලදී.

මධ්‍යම, වයඹ සහ ඌව පලාත්වල මල්වගා බෝග සංවර්ධනය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පාලත් සමුහ කාර්යය රැස්වීම සඳහා නිලධාරිහු සහභාගි වූහ.

**සංවර්ධන ක්‍රියාකාරකම්**

උද්‍යානයේ මල් වගා කටයුතුවල යහපත් කළමනාකරණය සඳහා මෙම අවුරුද්දේදී සැලසුම් කරන ලද අලුත්වැඩියා කිරීම් සහ ඉදිකිරීම් නිමා කරන ලදී. (ඕකිඩ් ගෘහයේ වහලය නැවත

සෙවිලි කිරිම, ඕකිඩ් වගාව සඳහා වීදුරු ගෘහය නැවත සෙවිලි කිරීම සහ අලුත්වැඩියාව, පන්ති කාමර සහ පේරාදෙණිය උද්භිද උද්‍යානයේ විසිතුරු පත්‍රික ශාක කේෂ්ත්‍ර කාර්යාලය අලුත්වැඩියා කිරීම සහ ගම්පහ උද්භිද උද්‍යානයේ ජර්බෙරා වගාව සඳහා පොලිතින් ගෘහ අලුත්වැඩියා කිරීම.)

**නිලධාරින් පුහුණුවීම් සහ ස්ථාන මාරුවීම්**



➢ මල්වගා පර්යේෂණ පිළිබඳ ජාතික සම්මේලනය සඳහා සහභාගිවූවන්

➢ විසිතුරු පත්‍රික ශාක සඳහා පංති කාමරය

➢ ඕකිඩ් නිවාසයේ වහලය නැවත සෙවිලි කිරීම

හම්බන්තොට වියළි කලාපිය සහ අවිස්සාවේල්ල තෙත් කලාපිය උද්භිද උද්‍යානවල ඇන්තූරියම් වගාව ආරම්භ කිරීම සඳහා කමලා මැණිකේ මිය එම උද්භිද උද්‍යානය සඳහා නිදහස් කරන ලදී.

මැයි 17 සහ 22 දින ඉන්දියාවේ බැංග්ලෝ නුවර පැවති IWMI හි අවසාන ප්‍රගති සමුළුව සඳහා බි.යූ.පී.ඒ.කේ.ඒ. රණසිංහ මිය සහභාගි වෙන ලදී.

චිනයේ වාණිජ අමාත්‍යශයේ අනුග්‍රහයෙන් " සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා මල් නිෂ්පාදන තාක්ෂණය '' යන මැයෙන් මහජන චීන සමුහාණ්ඩුව මඟින් 2011 වර්ෂයේ අප්‍රේල් 13 සිට මැයි 24 දක්වා පවත්වන ලද පුහුණු පාඨමාලාව සඳහා එම්.සී. වික්‍රමසිංහ මිය සහභාගි වෙන ලදී.



2011 වර්ෂයේ ජුනි සිට නොවැම්බර් දක්වා මාරුවීමක් මත හම්බන්තොට වියළි කලාපීය උද්භිද උද්‍යානයෙන් එම්.එම්.කේ.පී. වැලිකුඹුර මයා නිදහස් කළ අතර වර්තමානයේ පේරාදෙණිය උද්භිද උද්‍යානයේ මල් වගා පර්යේෂණ අංශය වෙත අනුයුක්ත කර ඇත.

එල්.ඒ.පී. පෙරේරා මිය සහ ඒ.එන්. අබේකෝන් මිය නෙදර්ලන්තයේ ඔවුන්ගේ විද්‍යාපති විභාගය අවසන් වි දෙපාර්තමේන්තුව වෙත පැමින නැවත වැඩ භාර ගන්නා ලදී .

අයි.ඩබ්.එම්.කරුණාරත්න මයා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත නිදහස් කරන ලදී.



**මල් වගා අංශය සඳහා අනුයුක්ත කර ඇති නිලධාරින්**

| නම | තනතුර | ස්ථානය/විෂය |
|---|---|---|
| කේ.එන්.යාපා මහතා | අධ්‍යක්ෂ (පර්යේෂණ හා තාක්ෂණ ප්‍රචාරණ) | |
| ආචාර්ය ශෙලොමී ඒ. ක්‍රිෂ්ණරාජා මෙනවිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ (මල් වගා පර්යේෂණ) | |
| එම්.සී. වික්‍රමසිංහ මිය | පර්යේෂණ නිලධාරි | ගම්පහ උද්භිද උද්‍යානය, ශෂ්‍ය විද්‍යාව |
| අනෝමා බෝවත්ත මිය | පර්යේෂණ සහකාර | ගම්පහ උද්භිද උද්‍යානය |
| ඒ.යෝගරාජා මයා | පර්යේෂණ සහකාර | ක්ෂුද්‍ර ප්‍රචාරණය |
| එම්.ඕ.ආර්.වී. පෙරේරා මිය | ප්‍රධාන කළමනාකරණ සහකාර | මල්වගා පර්යේෂණ සහ සංවර්ධනය අංශය |
| ආර්.එම්. කමලා මැණිකේ මිය | කෘෂිකර්ම උපදේශක | ඇන්තූරියම් අංශය |
| යූ.බී. පලිපාන මයා | කෘෂි මෙහෙයුම් නිලධාරි | ජලජ ශාක, ජර්බෙරා |
| ඒ.සී.එන්. සෙනෙවිරත්න මිය | කෘෂි මෙහෙයුම් නිලධාරි | පශ්චාත් අස්වනු කළමනාකරණය, ජෛව පොහොර |
| එම්.එම්.කේ.පී. වැලිකුඹුර මයා | කෘෂිකර්ම උපදේශක | විසිතුරු පත්‍රික ශාක අංශය |
| ඩබ්.එම්.ඩී.රී.ආර්. අන්ද්‍රාදි මෙනවිය | කෘෂිකර්ම උපදේශක | ඕකිඩ් අංශය |
| අයි.එච්.සී.එන්. සමන්තිකා මිය | කෘෂිකර්ම උපදේශක | විසිතුරු පත්‍රික ශාක අංශය විදේශ ගත වී සිටී (වැටුප් රහිත නිවාඩු ලබා ඇත.) |
| එම්.ඒ.එන්. ජයවර්ධන මිය | කෘෂිකර්ම උපදේශක | ** ගම්පහ උද්භිද උද්‍යානය සුවහස් මල් වැඩසටහන |
| ඩී.වී.ආර්.ඒ. පෙරේරා මයා | කෘෂිකර්ම උපදේශක | ** ගම්පහ උද්භිද උද්‍යානය සුවහස් මල් වැඩසටහන |
| එච්.එම්.ආර්. හේරත් මයා | වැඩසටහන් සහකාර | පටක රෝපණය |
| එම්.කේ. රූබසිංහ මයා | වැඩසටහන් සහකාර | ශාක අභිජනනය |
| අයි.ඩබ්.එම්.කරුණාරත්න මයා | වැඩසටහන් සහකාර | * සුවහස් මල් වැඩසටහන පුත්තලම දිස්ත්‍රික්කය 2011 වර්ෂයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත මාරුවීම් ලබා ඇත. |
| ආර්.ඒ.එස්.පෙරේරා මයා | වැඩසටහන් සහකාර | *සුවහස් මල් වැඩසටහන - මහනුවර |
| ** ඒ.එන්. අබේකෝන් මිය | වැඩසටහන් සහකාර | පලිබෝධ සහ රෝග කළමනාකරණය |
| **ඒල්.ඒ.පී. පෙරේරා මිය | වැඩසටහන් සහකාර | ශෂ්‍ය විද්‍යාව, පශ්චාත් අස්වනු කළමනාකරණය |
| එම්.උත්පලවර්ණා මිය | වැඩසටහන් සහකාර | *සුවහස් මල් වැඩසටහන - කෑගල්ල |
| කේ.ඒ.එස්. තිලකරත්න මිය | වැඩසටහන් සහකාර | *සුවහස් මල් වැඩසටහන - කෑගල්ල |
| ආර්.ඒ.එස්.පියසේන මයා | වැඩසටහන් සහකාර | *සුවහස් මල් වැඩසටහන - හක්ගල |
| ඒ.පී. සිරිවර්ධන මිය | වැඩසටහන් සහකාර | *සුවහස් මල් වැඩසටහන - ගම්පහ උද්භිද උද්‍යානය,ඇන්තූරියම් ක්ෂුද්‍ර ප්‍රචාරණය |
| ඒ.එන්. නානායක්කාර මිය | වැඩසටහන් සහකාර | *සුවහස් මල් වැඩසටහන - ගම්පහ උද්භිද උද්‍යානය,ඕකිඩ් ක්ෂුද්‍ර ප්‍රචාරණය |
| බී.යූ.ජී.ඒ.කේ.එන්. රණසිංහ මිය | වැඩසටහන් සහකාර | ගම්පහ උද්භිද උද්‍යානය- විදේශ ගත වී සිටී (වැටුප් රහිත නිවාඩු ලබා ඇත.) |
| ** ආර්.ඒ.එම්.අයි.රත්නායක මයා | වැඩසටහන් සහකාර | පටක රෝපණය, ජලජ ශාක සහ ජර්බෙරා වගාව - ගම්පහ උද්භිද උද්‍යානය |
| එච්.එම්.පී. පීරිස් මිය | වැඩසටහන් සහකාර | සුවහස් මල් වැඩසටහන - වියළි කලාපිය උද්භිද උද්‍යානය |

* "සුවහස් මල් " වැඩසටහන

** අධ්‍යයන නිවාඩු ලබා විදේශ ගත වී සිටින නිලධාරින්

**ජාතික ශාකාගාරය**

ජාතික ශාකාගාරය යනු ශ්‍රී ලංකාවේ ශාකවල වියළි ශාකාගාර නිදර්ශක එක් රැස් කර ඇති ස්ථානයකි. විදේශීය මෙන්ම වගා කරන ලද නිදර්ශක ක්‍රමානුකූල අධ්‍යයනය සඳහා ආරක්ෂා කර ඇත. සුදුසු තත්ත්ව යටතේ සංරක්ෂණය කළ 160,000 ආසන්න ශාකාගාර නිදර්ශක විමර්ශනය සඳහා තබා ඇත. ශාක හා සම්බන්ධ වූ උද්භිද විද්‍යාත්මක තොරතුරු ඇතුලත් සහ 3500 පමණ පොත් ද පුවත්පත්, සඟරා ආදිය ද මෙහි සංරක්ෂණය කර ඇත.

ජාතික ශාකාගාරය ශාක ගවේෂණය, නිදර්ශක හඳුනා ගැනිම සහ නිදර්ශක සැකසීම මෙන්ම තොරතුරු රැස් කිරීම, වර්ග කිරීම සහ ව්‍යාප්තිය ද දේශීය ශාක එකතුවෙහි ප්‍රතිශෝධනයන් පිළිබඳව සක්‍රිය දායකත්වයක් ලබාදෙයි.

දේශීය සහ විදේශීය පර්යේෂකයින් සඳහා ශාක වර්ගීකරණ පර්යේෂණ හා සම්බන්ධ පර්යේෂණ කාර්යයන් සඳහා ජාතික ශාකාගාරය පහසුකම් සලසනු ලබයි. එසේම ජාතික ශාක නිරෝධායතනය සහ රේගුව වෙත ශාක හා සම්බන්ධ නෛතික ගැටළු පැනු නැගුණ විට සහ ශාක ද්‍රව්‍යය ආනයනයේදි හා අපනයනයේදී නෛතික ගැටළු පැන නැගුණු විට ශාක හඳුනා ගැනීම සඳහා සේවය ලබා දෙයි. මෑතකදී ශ්‍රී ලංකාවේ ශාක පිළිබඳව ජාතික රතු දත්ත නාමාවළිය අධිකාරිය වශයෙන් ද ජාතික ශාකාගාරය පිළිගන්නා ලදී. ජාතික ශාකාගාරය සහ ලෝකයේ අනෙකුත් ප්‍රදේශවල පිහිටි පර්යේෂණ ආයතන සමග ශාක නිදර්ශක සහ දැනුම හුවමාරු කර ගැනීමේ කර්තවයේ ද නියැලී සිටියි.




**ශාක ගවේෂණය සහ ශාක ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යයනයට අදාල පර්යේෂණ**

**ක්ෂේත්‍ර ගවේෂණය**

ජෛව විවිධත්ව සංරක්ෂණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේ අරමුණින් ශාක ගවේෂණ වැඩසටහන් ශාක ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යයන්ට අදාල තොරතුරු එක් රැස් කිරීම කරන ලද අතර, වඳවී යන සහ දුර්ලභ පැළැටි හඳුනා ගන්නා ලදී. ශාක විතැන් සංරක්ෂණය ක්‍රියාවන් යොදා ගන්නා ලදී.

- සප්ත කන්‍යා කඳුවැටිය
- සුපෝෂණය කරන ලද ශාකාගාර එකතුව
- සප්ත කන්‍යා කඳු පංතිය පිහිටි ප්‍රදේශය

| වර්ග එකතුව | මුලාශ්‍රය | නිදර්ශක/කදාවන් සංඛ්‍යාව | | වැඩි දියුණු කිරීම |
|---|---|---|---|---|
| | | සකසන ලද | නිවැරදි බව තහවුරු කර එකතු කිරීම | |
| බීජ ශාක | 2009 වර්ෂයේ අම්බුළුවාවේ ක්ෂේත්‍ර ගවේෂණය | 30 | 30 | ජාතික ශාකාගාරය |
| | ආචාර්ය එම්.ජයසූරිය මහතාගේ ශාක එකතුව(කලාඔය සහ අනෙකුත් ප්‍රදේශ) | | 77 | ජාතික ශාකාගාරය |
| | ආචාර්ය එම්.ජයසූරිය මහතාගේ සහ එස් ප්‍රනාන්දු මහතාගේ කොග්ගල සහ අනෙකුත් ප්‍රදේශ වල ශාක එකතුව | | 177 | ජාතික ශාකාගාරය |
| | එස්.ප්‍රනාන්දු මහතාගේ දොළුවකන්ද ප්‍රදේශයේ ශාක එකතුව | | 34 | ජාතික ශාකාගාරය |
| | මහාචාර්ය එස්.ගුණතිලක මහතාගේ ශාක එකතුව | | 452 | ජාතික ශාකාගාරය |
| | කිතුල්ගල,දොලොස්බාගේ,දොළුවකන්ද ප්‍රදේශයේ ක්ෂේත්‍ර ගවේෂණය - 2010 | 36 | 36 | ජාතික ශාකාගාරය |
| | රාජකීය උද්භිද උද්‍යානයේ *Alphonesa hortensis* සහ *Memecylon macrocaroum* හා ශාක එකතුව | 7 | 7 | ජාතික ශාකාගාරය |
| විවෘත බීජක | රාජකීය උද්භිද උද්‍යානයේ උද්භිද විද්‍යාව (විශේෂ) සිසුවෙකුගේ ශාක එකතුව | 41 | 41 | ජාතික ශාකාගාරය |
| මීවන | ආර්.එම්.ජී.රනිල් මහතාගේ ශාක එකතුව (*Cyathea sp)* | 43 | 43 | ජාතික ශාකාගාරය |
| | මීවන මල්වල වවුචර් නිදර්ශක | 33 | 33 | ජාතික ශාකාගාරය |
| පාසි ශාක | ගන්නෝරුව ක්ෂේත්‍ර ගවේෂණ - 2008 | 15 | 15 | ජාතික ශාකාගාරය |
| | ශ්‍රී පාදය ක්ෂේත්‍ර ගවේෂණ - 2011 | 40 | 40 | ජාතික ශාකාගාරය |
| | හෝර්ටන්තැන්න ක්ෂේත්‍ර ගවේෂණය 2008/2010 | 90 | 90 | ජාතික ශාකාගාරය |
| | සප්ත කන්‍යා කඳු පන්තියේ ක්ෂේත්‍ර ගවේෂණය | 85 | 85 | ජාතික ශාකාගාරය |





ශ්‍රී පාදයේ මොරේ වතුයායෙහි එක්දින ක්ෂේත්‍ර ගවේෂණයේදී බීජ ශාක 65 ක් ද මීවන ශාක 07 ක් ද පාසි ශාක 40 ක් ද එකතු කරන ලදී.

***ශාක ගවේෂණය මඟින් ශාකාගාර නිදර්ශක හඳුනා ගැනීම සහ වැඩි දියුණු කිරීම.***

ක්ෂේත්‍ර ගවේෂණවලදී එකතු කර ගත් නිදර්ශක හඳුනා ගැනීම මෙන්ම වර්ගීකරණය ද කරන ලදී. නිදර්ශක කඳාවන් සකස් කළ අතර ජාතික ශාකාගාර එකතුව සඳහා ද ඇතුලත් කර වැඩි දියුණු කරන ලදී.

**පුස්තකාල එකතුව වැඩි දියුණු කිරීම.**

Mosses of eastern Indian and adjacent regions by H.C. Gangulee (3 volumes), A Compendium of the Macrolichens from India, Nepal and Sri Lanka by D.D. Awasthi, Indian Lichens: An Annonated Checklist by K.P. Singh and G.P. Sinha, The Flora of Gulf of Mannar by P.Danie, Taxonomic Revision of Three Hundred Indian Sub continental Pteridophytes with a Revised Census List A new picture of fern-taxonomy and nomenclature in the Indian Subcontinent by C.R. Fraser-Jenkins, යන පොත් මිලදී ගත් අතර, පුස්තකාලයේ විමර්ශන කටයුතු සඳහා එක් කරන ලදී.





**උද්භිද විද්‍යාත්මක තොරතුරු සත්‍යබව තහවුරු කිරීම සහ ව්‍යාප්තිය**

අවශ්‍ය පරිදි මහජනයා, සිසුන්, රාජ්‍ය නොවන ආයතන සඳහා ශාක සහ ඒ ආශ්‍රිත ප්‍රදේශවල නිවැරදි උද්භිද විද්‍යාත්මක තොරතුරු ව්‍යාප්ත කරන ලදී.

**නරඹන්නන්, රාජ්‍ය නොවන ආයතන වලට දෙන ලද තොරතුරු**

ශාකාගාර ක්‍රම වේද සහ කළමනාකරණය පිළිබඳ දැනුම ලබා ගැනීම සඳහා පුද්ගලයින් 1628 ද (පාසැල් ළමුන්, විශ්ව විද්‍යාල සිසුන්) ශාකාගාරය වෙත පැමිණෙන ලදී.



- ⮝ *උඩදුම්බර ප්‍රදේශයෙන් සොයා ගන්නා ලද දුර්ලභ Sonerila නිදර්ශක*
- ⮜ *ක්ෂේත්‍ර ගවේෂණයෙන් එක් රැස් කරන ලද පාසි*
- ⮟ *උඩදුම්බර ප්‍රදේශයේ පාර දෙපසින් සොයා ගන්නා ලද දුර්ලභ Mangifera zeylanica*



මහජනයා සහ සෙසු ආශ්‍රිත පාර්ශව මඟින් කරන ලද ඉල්ලීම් සඳහා උද්භිද විද්‍යාත්මක තොරතුරු සහිත ලිපි 130 ක් සඳහා පිළිතුරු සපයා ඇත.

ක්ෂේත්‍ර චාරිකාවලින් ලබා ගන්නා ලද බීජ ශාක 1822 ද, පාසි ශාක

230 ද, මීවන ශාක 85 ද හඳුනා ගන්නා ලදී.

ආර්.ඒ.එස්.ඩබ්. රණසිංහ මිය තෙල්දෙනිය උසාවියේ නඩුවක *Polownia tomentosa* හි විදේශික නිදර්ශකයක් හඳුන්වා දීම සම්බන්ධයෙන් උද්භිද විද්‍යාත්මක සාක්ෂියක් දීම සඳහා සහභාගි විය.

*Andrographis paniculata* var. *glandulosa* නිදර්ශක 04 ක් සහ ඡායාරූප ලබාදෙන ලදී.

***ශාකාගාරයේ වවුචර් නිදර්ශකවල සත්‍යබව සහතික කිරීම සහ තැන්පත් කිරීම***

හෙට්ටිගොඩ පුද්ගලික කර්මාන්තායතනයේ ඖෂධ සාරය ගැනීම අධ්‍යයනය සඳහා ශාක 41 ක් සත්‍යබව සහතික කරන ලදී.

ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂිත සිසුන් දෙදෙනෙකුගේ රසායන විද්‍යාත්මක පර්යේෂණ අධ්‍යයනය සඳහා ශාක 15 ක් සත්‍යබව සහතික කරන ලදී.

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ අවසන් වසර උපාධි අපේක්ෂිත සිසුන්ගේ පර්යේෂණ අධ්‍යයනය සඳහා ශාක 09ක් සත්‍යබව සහතික කරන ලදී.

හන්තාන මූලික අධ්‍යාපන ආයතනයේ රසායන විද්‍යාත්මක අධ්‍යයනය සඳහා ශාක නිදර්ශක 03 ක් සත්‍ය බව සහතික කරන ලදී.

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ වෛද්‍ය රසායනාගාර විද්‍යාවේ පශ්චාත් උපාධි අධ්‍යයනයක් සඳහා ශාක නිදර්ශකයක් සත්‍ය බව සහතික කරන ලදී.

කොළඹ විශ්ව විද්‍යාලයේ දේශීය වෛද්‍ය ආයතනයේ ඖෂධ අධ්‍යයනය සඳහා ශාක නිදර්ශකයක් සත්‍ය බව තහවුරු කරන ලදී.





- දැනුවත් කිරීමේ වැඩසටහනක්
- ආධුනික පුහුණු සිසුන් හන්තාන ප්‍රදේශයේ ක්ෂේත්‍ර ගවේෂණයක යෙදී සිටින අයුරු

පිළිවෙලින් කර්මාන්ත තාක්ෂණික ආයතනයේ, ඖෂධ තාක්ෂණ අංශය , කොළඹ විශ්ව විද්‍යාලයේ රසායන විද්‍යා දෙපාර්තමේන්තුව කර්මාන්ත පුහුණු ආයතනයේ හා ආහාර තාක්ෂණ ආයතනයේ පර්යේෂණ කාර්යය සඳහා ශාක නිදර්ශක 07 ක් සත්‍ය බව සහතික කරන ලදී.



රාජකීය උද්භිද උද්‍යානයේ ජීවර්තු විද්‍යාත්මක
⮝ *Sophora violacea*

⮟ *Syzygium firmum*



**පුහුණුව සහ අධ්‍යාපනය**

අධ්‍යාපනික වැඩසටහන් සප්ත කන්‍යා කඳු පංතිය සහ හෝටර්තැන්න පිළිබඳව පුහුණු වැඩසටහන් සහ දේශන පවත්වන ලදී. එහිදී ආවෘත බීජක නිදර්ශක 48 ද, මීවන නිදර්ශක 16 ද, පාසි නිදර්ශක 155 ද සහ හන්තාන ප්‍රදේශයේ මී වන නිදර්ශක 10 ක් ද සහ අනුරාධපුරයෙන් ජලජ ශාක නිදර්ශක 25 ක් ද එකතු කරන ලදී. 2011 වර්ෂයේ ජුනි මාසයට පසුව රිටිගලින් ආවෘත බීජක නිදර්ශක 19 ක් ද හෝටර්තැන්නෙන් ආවෘත බීජක නිදර්ශක 18 ක් ද සහ සිංහරාජයෙන් ආවෘත බීජක නිදර්ශක 53 ක් ද එකතු කරන ලදී. ශාක සහ ජෛව විවිධත්ව සංරක්ෂණය පිළිබඳ දැනුම වර්ධනය කිරීම සඳහා ශාක ගවේෂණය, හඳුනා ගැනීම, නාමකරණය, ශාකාගාර කළමනාකරණය, ජෛව විවිධත්වය සහ සංරක්ෂණය සිදු කරන ලදී.

වන ජීවී දෙපාර්තමේන්තුව , ශ්‍රී ලංකා ක්ෂේත්‍ර උද්භිදවේදීන්ගේ සංගමය, නුවරඑළිය ශ්‍රී ලංකා වන ආයතනය, තරුණ සත්වවේදීන්ගේ සංගමය, වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය, දේශීය වෛද්‍ය ආයතනය, මාදුරු ඔය විශේෂ කාර්ය බලකායේ පුහුණු පාසැල (ගුරුවරුන්ද ඇතුලත්ව), පාසැල් ළමුන්, විශ්ව විද්‍යාල සිසුන්, භූමි අලංකරණය සහ මල් වගාව පිළිබඳ ත්‍රෛමාසික පාඨමාලාවද ඇතුළත් සහභාගිවන්නන් 1209 සඳහා ශාකාගාරයේ ඉතිහාසය, ශාක ගවේෂණය සහ ශාකාගාර ක්‍රමවේද පිළිබඳ එක් දින පුහුණු වැඩසටහන් 25 පවත්වන ලදී.

පාසැල් ළමුන් ඇතුළුව සහභාගිවන්නන් 215 ක් සඳහා ශාක වර්ගීකරණ විද්‍යාව සහ ජෛව විවිධත්වය පිළිබඳ එක්දින දේශන වැඩසටහන් 06 ක් පවත්වන ලදී.

***ආධුනික පුහුණු වැඩසටහන්***

රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතනවල සිසුන්/කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා විශේෂ ආධුනික පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

ජර්මන් සිසුන් සඳහා ශාකාගාර සහ රාජකීය උද්භිද උද්‍යානයේ කාර්යයන් පිළිබඳව සතියක ආධුනික වැඩසටහනක් පවත්වන ලදී.

ජාතික ශාකාගාරයේ ශාකාගාර එකතුව වැඩි දියුණු කිරීම සඳහා ශාකාගාර සහ ක්ෂේත්‍ර ගවේෂණ කාර්යයන් පිළිබඳ එක් අවුරුදු ආධුනික වැඩසටහනක් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ විද්‍යාවේදී වන සහ පරිසර විද්‍යා පිළිබඳ සිසුවෙකු විසින් අධික්ෂණය කරන ලදී.

ජාතික ශාකාගාරයේ ශාකාගාර ක්‍රමවේද සහ කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික ස්ථානගත වැඩසටහනක් රාජකීය උද්භිද උද්‍යානයේ මල්වගා සහ උද්‍යාන අලංකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාවේ සිසුන්

දෙදෙනෙකු විසින් හදාරනු ලබන ලදහ.

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ උද්භිද විද්‍යා දෙපාර්තමේන්තුවේ උද්භිද විද්‍යා විශේෂවේදී උපාධිය හදාරන සිසුන් 11 දෙනෙකු සඳහා හන්තාන කඳුකරයේ දුර්ලභ ශාක නිදර්ශක පිළිබඳ ක්ෂේත්‍ර ගවේෂණයක් සඳහා පහසුකම් සලසන ලදී.

සබරගමු විශ්ව විද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨයේ සිසුන් තිදෙනෙකු ජාතික ශාකාගාරයේ දෙසතියක ආධුනිකත්ව වැඩසටහනක් සඳහා සහභාගි වෙන ලදී.

කැලණිය විශ්ව විද්‍යාලයේ සිසුන් තිදෙනෙකු ශ්‍රී ලංකාවේ මල් වර්ග යොදා ගනිමින් සතියක් ආධුනික වැඩසටහනක් වශයෙන් ආරෝහක/කාෂ්ඨාරෝහක නිදර්ශක පිළිබඳව දත්ත සම්පාදනය සඳහා ද සහාය ලබාදෙන ලදී.

සීමාසහිත එන්.බී.සී. (නැචුරල් බියුටි ක්‍රියේෂන්) ආයතනයෙන් ශාකාගාරයක් වැඩි දියුණු කිරීම පිළිබඳ දින පහක විශේෂ පුහුණුවක් පවත්වන ලදී.

**ජාතික රතු දත්ත නාමාවලී ව්‍යාපෘති**

ජාතික රතු දත්ත නාමාවලී ව්‍යාපෘතිය වඳවී යාමේ අවදානමට ලක් වී ඇති ශාක පිළිබඳව ජාතික රතු දත්ත නාමාවලී ග්‍රන්ථය සකස් කිරීමට අවශ්‍ය නිදර්ශක ඇගයීම් සහ තොරතුරු එක් රැස් කිරීම පරිසර අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව ලේකම් කාර්යාලයේ සහයෝගීත්වයෙන් සිදු කරන ලදී.

ජාතික රතු දත්ත නාමාවලී ග්‍රන්ථය ප්‍රකාශයට පත් කිරීමට සූදානම් කර ඇත.

ජාතික රතු දත්ත නාමාවලී ඇගයුම් වැඩසටහන මෙම වසරේ ක්‍රියාත්මක කළ අතර 34,349 සටහන්, 1205 නිදර්ශක අංක සහ ආවෘත බීජක වංශයට අයත් (Phylum Angiospermae) 48 කුල අංක සහ 5556 නිදර්ශක අංක, 286 නිදර්ශක අංක සහ ටෙරිඩොපීට වංශයට අයත් කුල අංක 23 ද (මීවන විශේෂයකි) ඇගයීමට ලක් කරන ලදී.

ශාකාගාරය කාර්ය මණ්ඩලය සහ ජාතික උද්භිද උද්‍යානයේ මල් වගා පිළිබඳ විශේෂඥයින්, විශ්ව විද්‍යාල ,ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය සහ සෙසු සංවිධායකයින් විශේෂඥයින්ගේ කමිටු රැස්වීම් හතක් සඳහා සහභාගි වෙන ලදී. ආවෘතබීජක (Angiospermae සහ මීවන (Ferns) ) නිදර්ශක 84 ක් ඇගයුමට ලක් කරන ලදී.






▲තැන්පත් කිරීම සඳහා නිදර්ශකයකට ප්‍රතිකාර ලබාදෙන අයුරු

▼ නව පුස්තකාල එකතුව

**පරිග්‍රහණය සහ ශාකාගාර දත්ත නිරවුල්ව ප්‍රකාශ කිරීම**

ශාකාගාර නිදර්ශක පරිග්‍රහණය කිරීම සඳහා මූලික ක්‍රියාකාරකම් ආරම්භ කරන ලදී.

ජාතික ශාකාගාරයේ ඩිජිටල් ශාකාගාර එකතුවක් ස්ථාපිත කිරීම සඳහා නිදර්ශක 200 ක් ඩිජිටල් ජායාරූප ගත කිරීම, රූපසටහන් 500 ඩිජිටල් ජායාරූප ගත කිරීම, දුර්ලභ සහ වඳවී යන ශාක නිදර්ශක 2000 ඩිජිටල් ජායාරූප ගත කිරීම සම්පූර්ණ කරන ලදී.

ශ්‍රී ලංකාවේ ශාක (*Flora of Ceylon)* ග්‍රන්ථය සම්පාදනය කිරීම සඳහා අත්පොත සංස්කරණය කරන ලද අතර ග්‍රන්ථයෙහි සමස්ත වෙළුම් 08 ක සංස්කරණය සම්පූර්ණ කරන ලදී.

පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ දුර්ලභ/වඳ වී යන සහ ආවේණික විශේෂ වර්ග පිළිබඳව ජීවර්තු විද්‍යාත්මක විස්තර වාර්තා කිරීම ආරම්භ කිරීම ක්‍රියාත්මක කරන ලදී.

**ශාකාගාර නිදර්ශක සහ සෙසු එකතුන් නඩත්තුව**

ශාකගාරයේ ශාක නිදර්ශක, පුස්තකාල එකතුව සහ අනෙකුත් එකතුවල නඩත්තු කටයුතු නිසි පරිදි පවතවාගෙන යන ලදී

**සාමාන්‍ය නඩත්තු කටයුතු**

16,124 ක් ශාකාගාර නිදර්ශක අලුත්වැඩියා කිරීම ද, 220 ක් කෘමි උවදුරට ලක් වූ නිදර්ශක සඳහා පිළියම් කිරීම (විෂ යෙදීම) ද 8,436 නිදර්ශක ප්‍රමාණයක් අධි ශිතකරණයේ තැබීම ද, 194 ක් නිදර්ශක රෝහණය කිරීම ද, 27 ක් නිදර්ශක නැවත රෝහණය කිරීමද, 2,846 නිදර්ශකවලට ආවරණ එකතු කිරීම ද, 28,726 ගණවලට ආවරණ එකතු කිරීමද, 28,726 නිදර්ශක සහ 1,031 පොත් පවිත්‍ර කිරීම ද, 756 නිදර්ශක කුට්ටනය කිරීම ද, 4,898 ආවරණය කරන ලද ගණවලට, නිදර්ශක ගණවලින් යුත් ලේබල් ටයිප් කිරීම ද කරන ලදී.

**සාමාන්‍ය නඩත්තු කටයුතු, අලුත්වැඩියාව සහ ජාතික ශාකාගාරය සඳහා මිලදී ගැනීම් කටයුතු**

ජාත්‍යන්තර මට්ටමේ ශාකාගාර නිදර්ශක සංරක්ෂණය කිරීම සඳහා අධි ශිතකරණයක් මිලදී ගන්නා ලදී.

නිදර්ශකවලට විෂ යෙදීමේදී ආරක්ෂිත උපකරණ සහ ඇඳුම් මිලදී ගන්නා ලදී.

වර්ගීකරණ අධ්‍යයනයේදී උසස් තත්ත්වයෙන් යුත් ඩිජිටල් රූප ගැනීම සඳහා කැමරා රෝහණය කිරීමේ ක්‍රමවේදය ඇතුලත් විදුලි උපකරණ මිලදී ගන්නා ලදී.

වර්ගීකරණ අධ්‍යයනයේදී උසස් තත්ත්වයකින් යුත් ජායාරූප ගැනිම සඳහා මැක්‍රො ( Macro) කාච සහිත ඩිජිටල් කැමරාවක් මිලදී ගන්නා ලදී.

පැරණි ශාක එකතුව සඳහා වූ ගෙඩනැගිල්ලේ වහලයේ අලුත්වැඩියා කටයුතු නිම කරන ලදී.

**කාර්ය මණ්ඩල තොරතුරු**

ආර්.ඒ.එස්.ඩබ්. රණසිංහ මිය
පර්යේෂණ නිලධාරි
බී.එස්.(උද්භිද විද්‍යා ), එම්.එස්සී.

එන්.පී.ටී.ගුණවර්ධනමිය
කෘෂි මෙහෙයුම් නිලධාරි බී.එස්සී. (උද්භිද විද්‍යා), එම්. එස්සී

ජී.ෆොන්සේකාමිය
වැඩසටහන සහකාර
බී.එස්සී. (උද්භිද විද්‍යා), එම්. එස්සී

ප්‍රේමනී කරුණාරත්න මිය
කළමනාකරණ සහකාර
අ.පො.ස.(උ/පෙළ)

එස්.ඒ.පද්මිණිමිය
පර්යේෂණ උප සහකාර
අ.පො.ස.(සා/පෙළ)

අයි.ඒ. කුමාර මැණිකේ මිය
කම්කරු 111 අ.පො.ස.(උ/පෙළ)

එච්.එම්.යූ. වීරසේකර මයා
කම්කරු 111 8 ශ්‍රේණිය

ඩබ්.ඒ.පී.එන්. කුමාරසිංහ මයා
කොන්ත්‍රාත් කම්කරු
අ.පො.ස.(උ/පෙළ)

***මාරුවීම් සහ විශ්‍රාම යාම්***

නියෝජ්‍ය අධ්‍යක්ෂ ආචාර්ය ඒ.එම්.ඒ.එස්. අත්තනායක මිය. 2011 ජුනි 28 දින රාජකීය උද්භිද උද්‍යානය වෙත මාරුවීමක් ලබන ලදී.

ආර්.ඒ.එස්.ඩබ්. රණසිංහ මිය ප්‍රසූත නිවාඩු ලබා පැමිණ 2011 ජූනි 13 දින නියෝජ්‍ය අධ්‍යක්ෂකගේ භූමිකාව ආවරණය කිරීම සඳහා වැඩ භාර ගන්නා ලදී.

ගයනි ෆොන්සේකා මිය 2011 ඔක්තෝම්බර් 07 දින ප්‍රසූත නිවාඩු ලබා ගන්නා ලදී.

පර්යේෂණ උප සහකාර එස්.ඒ. පද්මිණී මිය අප්‍රේල් 08 දින විශ්‍රාම ලබා ගන්නා ලදී.

## හක්ගල උද්භිද උද්‍යානය

හක්ගල උද්භිද උද්‍යානය ආරම්භ කරන ලද්දේ ශ්‍රී ලංකාවේ සින්කෝනා වගාව පර්යේෂණ මට්ටමින් අත්හදා බැලීම සහ ප්‍රචලිත කිරීමට ය. කඳුකරයේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ තේ වතු සහිත පරිසරයක පිහිටා ඇති අතර, මෙම උද්‍යානය දිවයිනේ දෙවැනි විශාලතම උද්භිද උද්‍යානය ලෙස සැලකේ.

මුහුදු මට්ටමින් අඩි 1745 කට ඉහලින් අලි හක්කක හැඩරුව ඇති හක්ගල කන්ද සහ එයට පාමුල ඇති හක්ගල දැඩි රක්ෂිතය පදනම් කර ඇති මෙම උද්‍යානය හෙක්ටයාර් 28 ක් තුළ පැතිර ඇත. නුවරඑළිය නගරයට ඊසාන දෙසින් බදුල්ල මාර්ගයේ කි.මී. 9.5 ක් දුරින් උද්‍යානය පිහිටා ඇත.



**නරඹන්නන්ගේ පැමිණීම**


2011 වර්ෂයේදී ද නරඹන්නන් 510,116 (දේශීය නරඹන්නන් 500,024 සහ විදේශීය නරඹන්නන් 10,092) උද්‍යානය නරඹා ඇති අතර එය පසුගිය වසර හා සංසන්දනය කරන විට වැඩිවීමක් පෙන්නුම් කරයි.

**ආදායම**

මෙම වසරේදී 79,055 පැළ ප්‍රමාණයක් (පරිබාහිර සහ ගෘහස්ථ) ද 3,093 ක් බීජ පැකට් ද සහ 11,349 නැවුම් මල් ද උද්‍යානයේ අලෙවි මධ්‍යස්ථානයේදී විකුණා ඇති අතර, 10,029 ක් නැවුම් කැපූ මල් කොළඹ පිහිටි " සුවහස් මල් " අලෙවිසැලේදී විකුණා ඇත. 5,544 ක් මෝටර් කාර්වලින් ද 742 ක් මෝටර්සයිකල්වලින් සහ පාපැදි අටකින් ද උද්‍යානය වෙත මිනිසුන් පැමිණ ඇත.


රු. 34,513,127.39 මුදලක් පහත සඳහන් කාණ්ඩ යටතේ උද්‍යානය මෙම අවුරුද්ද තුල උපයා ඇත;

| කාණ්ඩය | ආදායම (රු.) |
|---|---|
| නරඹන්නන් | 29,752,890.09 |
| වාහන ඇතුළුවීම් | 887,450.00 |
| පැළෑටි සහ ඒ ආශ්‍රිත විකිණීම් | 3,517616.80 |
| ප්‍රකාශන අලෙවිය | 5,385.00 |
| සංචාරක බංගලාව වෙන් කිරීම | 305,489.00 |
| රූගත කිරීම් සහ අනෙකුත් | 44,296.00 |
| **එකතුව** | **34,513,127.39** |




- 2011 වර්ෂයේ මාසිකව විදේශීය නරඹන්නන්ගේ පැමිණීම
- ශිඛර උද්‍යානය
- 2011 වර්ෂයේ මාසිකව දේශීය නරඹන්නන්ගේ පැමිණීම





**ශාක එකතුව සහ ශාක විතැන් සංරක්ෂණය**

උද්‍යානයේ ශාක එකතුව වැඩි දියුණු කිරීම සහා එළිමහන් පැළ 63,017 ක් සහ ගෘහස්ත පැළ 11,509 ක් නිපදවන ලද අතර එසේම නව පැළ වර්ග 10 ක් පැළ තවාන් සඳහා එක් කරන ලදී.

කඳුකර කලාපයේ ඖෂධ පැළෑටි පිළිබඳ දත්ත පද්ධතියක් සෑදීම ක්‍රියාත්මක කරන ලදි. ශාක විශේෂ වලට අනුකූලව පැළ 125 ක විස්තර දත්ත පද්ධතිය සඳහා එක් කරන ලදි.

උද්‍යානයේ ශාකාගාරයේ පවතින දත්ත පද්ධතිය සඳහා නිදර්ශක 125 විස්තර එක් කරමින් ශාකාගාරවෙහි නිසි පරිදි නඩත්තු කරන ලදී. සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදී.

ශාකාගාර නිදර්ශක නිදර්ශක 271 පවිත්‍ර කිරීම සහ නිදර්ශක 55 ක් රෝහණය කිරීමෙන් ශාකාගාර කළමනාකරණය ද ක්‍රියාත්මක කරන ලදි.







⮝ මල්වත්ත දිස්වෙන අයුරු
➤ උද්‍යානයේ රුක් උයන
⮟ උද්‍යානයේ රෝස උයන

ක්ෂේත්‍ර ගවේෂණ දෙකක් ක්‍රියාත්මක කරන ලද අතර, පැළෑටි නිදර්ශක 55 ක් සොයා ගන්නා ලදී. ජාතික ශාකාගාරයේ උපකාරය සහිතව නිදර්ශක 22 ක් හඳුනා ගන්නා ලදි.

ශාක එකතුව වැඩි දියුණු කිරීම සහ උද්‍යානය අලංකරණය කිරීමේ අරමුණින් පැළෑටි 21,250 ක් උද්‍යානය තුළ රෝපණය කරන ලදි.

ශාක ලේබල් 851 ක් සවි කරන ලදි. විස්තරාත්මක ලේබල් නිර්මාණය කරන ලද අතර පැළෑටිවල සවි කරන ලදී. උද්‍යානයේ ශාක එකතුව වැඩි දියුණු කිරීම සඳහා ශාක ලේබල් 100 ක් අලුත්වැඩියා කරන ලදී. ශාක ලේබල් සවි කිරීම හා නඩත්තුව මගින් විද්‍යාත්මක තොරතුරු සහ සෙසු ශාක ආශ්‍රිත දත්ත මහජනයා වෙත ව්‍යාප්ත කරන ලදී. ප්‍රදේශයේ අනාරක්ෂිත වෘක්ෂ 170 ක් වැටීමට පෙර අධ්‍යනය කරන ලදී.

**අධ්‍යාපනය සහ තොරතුරු ව්‍යාප්ත කිරීම**

පාසැල් ළමුන්ද ඇතුළුව විවිධ වයස් කාණ්ඩ සඳහා මල් වගාව, භූමි අලංකරණය රෝස වගාව සහ ජෛව විවිධත්වය සංරක්ෂණය පිලිබඳ අධ්‍යාපන සහ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

මෙම වසරේ පවත්වන ලද පුහුණු වැඩසටහන් පහත පරිදි වේ. හොරණ නේචර්ස් බියුටි ක්‍රියේෂන්ස් ලිමිටඩ් ආයතනයෙන් සහ සහභාගිවන්නන් 09 ක් ද ; ජර්බෙරා වගාව සඳහා පුහුණු වැඩසටහනකට හාවාඑළිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලයෙන් 32 ක් ද; රෝස වගාව සහ විසිතුරු ශාක වගාව සඳහා අ.පො.ස (උ.පෙළ) ව්‍යාපෘති සිසුන් දෙදෙනෙක් ද; සබරගමු විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂිත සිසුවියක් සඳහා ශාක ප්‍රචාරණය පිළිබඳ පුහුණු වැඩසටහනක් ද ; පැල්වෙහෙර කෘෂිකර්ම විද්‍යාලයේ පුහුණු සිසුන් 36 සඳහා භූමි අලංකරණය සහ රෝස වගාව පිළිබඳ පුහුණු වැඩසටහනක්ද ප්‍රයෝගික සැසි සමඟ පවත්වන ලදී.





- ⮙ මහජනයා උද්‍යානයට පැමිණ විනෝදවෙන අයුරු
- ➢ අධ්‍යාපන වැඩසටහනක් පවත්වාගෙන අයුරු

නුවරඑළිය දිස්ත්‍රික්කයේ සුවහස් මල් සංගම්වල වගාකරුවන් 34 ක් සඳහා මල් වගාව පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී.

නුවරඑළිය ප්‍රදේශයේ මල් වගාව පිළිබඳ පුහුණු පංති, අ.පො.ස. (උ.පෙළ) සිසුන්ගේ ව්‍යාපෘති සඳහා උපකාර කිරීමක් වශයෙන් කැපූ මල් සහ කැපූ පත්‍ර පිළිබඳ පුහුණු පංති ද; පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂිත සිසුන් සඳහා රෝස වගාව පිළිබඳව ද; මධ්‍යම කඳුකරයට යෝග්‍ය භූමි අලංකරණ ක්‍රමවේද, මධ්‍යම පළාතේ කෘෂි විද්‍යා ගුරුවරුන් 41 සඳහා මල් වගාව සහ කැපූ පත්‍ර වගාව පිළිබඳ පුහුණු පංති පවත්වන ලදී.

රෝස සහ කානේෂන් වගාව පිළිබඳ සිසුන් 25 ද, ඕකිඩ් සහ කැපූ පත්‍ර වගාව පිළිබඳ සිසුන් 27 ද, ගල්පාලම කෘෂි විද්‍යා පාසැලේ සිසුන් 25 ද සඳහා ඇන්තූරියම් සහ ජර්බෙරා වගාව සඳහා පංති පවත්වන ලදී.

දියතලාව හමුදා කඳවුරෙහි උපාධි අපේක්ෂිත සිසුන් 112 ක් සඳහා උද්‍යාන ඉතිහාසය සහ උද්‍යානයේ වැදගත්කම පිළිබඳ දේශනයක් පවත්වන ලදී.

**සංවර්ධන ක්‍රියාකාරකම්**

උද්‍යානයේ සමහර කොටස්වල ස්ලැබ් ඇතිරීමෙන් මාර්ග වැඩි දියුණු කරන ලදී. රෝස වගාව සහ රෝස පැළෑටි සඳහා පොලිතීන් ගෘහ ඉදිකරන ලදී.

ගිම්හාන කුටි සහ වැසිකිලි අලුත්වැඩියා කරන ලදී.

උද්‍යානයේ අපද්‍රව්‍යය පොහොර/පස් තත්ත්වා රෝපකයක් වශයෙන් දිගුකාලීනව නැවත භාවිතය සඳහා කොම්පෝස්ට් පොහොර සඳහා ස්ථානය පිහිටුවන ලදී.

උද්‍යාන භූමි අලංකරණ කටයුතු කාර්යක්ෂම කළමනාකරණය සඳහා නවීන යන්ත්‍ර, උපකරණ සහ උද්‍යාන උපකරණ මිලදී ගන්නා ලදී.







- ⮝ පැල ගෘහයේ වහලය අලුත්වැඩියාවෙන් පසු
- ➤ පොලිතින් ගෘහවල රෝස වැවි ඇති අයුරු
- ⮟ වැඩිදියුණු කරන ලද ශිඛර උද්‍යානයේ අඩිපාරවල්

**විශේෂ අමුත්තන්ගේ පැමිණීම**

සිංගප්පූරු පාර්ලිමේන්තුවේ පෙර
සිටි ලේකම්වරයා උද්‍යානය
නරඹන ලදී.

**කාර්ය මණ්ඩල තොරතුරු**

***2011 වර්ෂයේ ඒකකයේ පවතින තනතුරු පිළිබඳ තොරතුරු***

| | **තත්ත්වය** | **පවතින තනතුරු සංඛ්‍යාව** |
|---|---|---|
| 1. | උද්‍යාන සහකාර | 1 |
| 2. | කළමනාකරණ සහකාර සේවය | 2 |
| 3. | බංගලා භාරකරු | 2 |
| 4. | උද්‍යාන කංගානි | 2 |
| 5. | රසායනාගාර උප සහායක | 1 |
| 6. | ශාස්ත්‍ර අයකිරීමේ සහකාර | 2 |
| 7. | රියදුරු | 1 |
| 8. | බද්ධකරු | 1 |
| 9. | ස්ථිර කම්කරු | 39 |
| 10. | කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් කම්කරුවන් | 13 |
| 11. | පෙදරේරු | 1 |
| 12. | ලේබල් ලියන්නන් | 1 |
| 13. | තෘණ කපන යන්ත්‍ර ක්‍රියාකරු | 2 |
| 14. | ගබඩාකරු | 1 |
| 15. | තවාන්කරු | 1 |
| | **එකතුව** | **70** |

***මාරුවීම් සහ විශ්‍රාම යාම***

උද්‍යාන සහකාර ඒ.බී, මැද්දේගොඩ මහතා හම්බන්තොට වියළි කලාපීය උද්භිද උද්‍යානය වෙත 2011 වර්ෂයේ ජනවාරි 08 දින මාරු කරන ලදී.

ශාස්ත්‍ර අයකිරීමේ සහකාර එස්.කේ. ජයසේකර මයා සහ එන්.ආර්. දිසානායක මයා උද්‍යානයෙන් පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය වෙත 2011 වර්ෂයේ නොවැම්බර් 20 දින මාරු කරන ලදී.

කළමනාකරණ සහකාර ඒ.එම්.යූ.එස්. කුමාරි මිය උද්‍යානයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත මාරු කර හරින ලදී.

# ගම්පහ උද්භිද උද්‍යානය

ශ්‍රී ලංකාවේ රබර් වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය 1876 දී ස්ථාපිත කරන ලදි. එය ගම්පහ නගරයේ සිට කි.මී. 2 නුදුරින් ගම්පහ මීනුවන්ගොඩ මාර්ගයේ පිහිටා ඇත. මුලින්ම එහි වපසරිය අක්කර 36 වූ අතර, 2005 දී අක්කර 07 ක් ඊට එකතු කරනු ලැබි ය. එහි වර්තමාන වපසරිය අක්කර 43 වේ.

ප්‍රදේශයේ ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම සඳහා ශාක විතැන් සංරක්ෂණය, මල් වගාව හා භූමි අලංකරණය පිළිබඳ අධ්‍යාපන හා ව්‍යාප්ති සේවා පැවැත්වීම, උද්භිද තොරතුරු බෙදා හැරීම, උද්‍යාන අලංකරණ විද්‍යාව ප්‍රවර්ධනය කිරීම සඳහා මල් වගාව හා පටක රෝපණය පිළිබඳ පර්යේෂණ සිදු කිරීම, ආගමික හා ඓතිහාසික වශයෙන් වැදගත් වෘක්ෂ ආරක්ෂා කිරීම හා නඩත්තුව, අලෙවිය සහ සාමාන්‍ය නඩත්තු කිරීම සඳහා පැළෑටි නිෂ්පාදනය, සුළු පරිමාණ මල්වගාකරුවන් සඳහා වෙළඳපොලක් ලබාදීමට මල් ප්‍රදර්ශන සංවිධාන කිරීම මෙම උද්‍යානය මගින් සිදු කරනු ලබන ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.



**නරඹන්නන්**

186,326 නරඹන්නන් (දේශිය නරඹන්නන් 186,117 සහ විදේශිකයින් 209) මෙම වසරේදී උද්භිද උද්‍යානය නරඹා ඇති අතර එය පසුගිය වසර හා සංසන්දනයේදී වැඩිවීමක් දක්නට ලැබෙන අතර (194) 2011 වර්ෂයේ උද්භිද උද්‍යානයට පැමිණි විදේශිය නරඹන්නන්ගේ සංඛ්‍යාවේද පෙර වසර හා සංසන්දනය කරන විට වැඩිවීමක් දක්නට ලැබේ.


**ආදායම**

මෙම වසරේදී එළිමහන් සහ ගෘහස්ථ පැළ සහ සෙසු පැළ ආශ්‍රිත ද්‍රව්‍යය විකුණන ලදී. මෝටර් කාර් 9,468, මෝටර් සයිකල් 12,206 සහ පාපැදි 52 කින් මිනිසුන් උද්‍යානය නැරඹීම සඳහා පැමිණෙන ලදහ

උද්‍යානයේ නිර්මාණය කරන ලද වැව සඳහා හඳුන්වා දුන් පැඩල් බෝට්ටු නරඹන්නන් 4,942 ක් භාවිත කරන ලද අතර විනෝද්ස්වාදය ලබා ගන්නා ලදී.


මෙම වසරේ සම්පූර්ණ ආදායම වන රුපියල් 13,231,414.00 මුදල පහත කාණ්ඩ යටතේ උපයන ලදී;

| කාණ්ඩය | ආදායම (රු.) |
|---|---|
| නරඹන්නන් | 8,613,401.00 |
| ඇතුළුවෙන ලද වාහන | 2,336,950.00 |
| පැළෑටි සහ සෙසු ආශ්‍රිත අලෙවිය | 579,735.00 |
| ප්‍රකාශන අලෙවිය | 11,715.00 |
| පිට්ටනි කුලිය | 528,000.00 |
| රූපගත කිරීම් සහ සෙසු | 173,213 |
| බෝට්ටු සවාරි | 988,400.00 |
| **එකතුව** | 13,231,414.00 |




- උද්‍යානයට 2011 වසරේදී විදේශිය නරඹන්නන්ගේ පැමිණීම
- උද්‍යානයේ මල් අංශය
- උද්‍යානයට 2011 වසරේදී දේශිය නරඹන්නන්ගේ පැමිණීම






ශ්‍රී ලංකාවේ දුර්ලභ, ආවේණික ශාක සහ උද්‍යානයේ දක්නට නොලැබෙන ශාක විශේෂ 62 ක් එකතු කරන ලදී. තර්ජනයට ලක් වූ දුර්ලභ ශාක සහ උද්‍යානයේ දක්නට නොලැබෙන ශාක සඳහා විතැන් සංරක්ෂණ ක්‍රම යොදා ගන්නා ලදී. රුක් උයන සඳහා ක්ෂේත්‍ර ගවේෂණයන්ගෙන් ලබාගත් ශාක 68 ක්

එකතු කරන ලද අතර, උද්‍යානයේ පවතින ශාක එකතුව මැනවින් පවත්වාගෙන යන ලදී. දිවයින පුරා විවිධ පන්සල්වල ඉල්ලීම පරිදි ඓතිහාසික සහ ආගමික වටිනාකමක් ඇති වෘක්ෂ 20 සඳහා ප්‍රතිකාර කරන ලදී.

උද්‍යානයේ ශාක එකතුව වැඩි දියුණු කිරීමට සහ විද්‍යාත්මක තොරතුරු ව්‍යාප්ත කිරීමට පියවර ගන්නා ලදී. ශාක පිළිබඳව සෙසු ආශ්‍රිත දත්ත මහජනයා වෙත ව්‍යාප්ත කරලීම සඳහා ශාක ලේබල් 750 ක් සෑදීමට සහ විස්තරාත්මක ලේබල් 05 ක් සෑදීමට පියවර ගන්නා ලදී.

**අධ්‍යාපනය සහ තොරතුරු ව්‍යාප්ත කිරීම**

මල් වගාව, භූමි අලංකරණය, ජෛව විවිධත්වය සංරක්ෂණය පිළිබඳ පුහුණු පාඨමාලා වැනි විවිධ මට්ටමේ කණ්ඩායම් සඳහා පවත්වන ලදී.

ශාක සංරක්ෂණය සහ ජෛව විවිධත්වය පිළිබඳ ප්‍රදේශයේ පාසැල් ළමුන් 344 ක් දැනුවත් කිරීම සඳහා වැඩසටහන් 05 ක් පවත්වන ලදී . පහත සඳහන් පරිදි එක් දින පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී;

| කාණ්ඩය | පුහුණුවන්නන් |
|---|---|
| පැළ තවාන් කළමනාකරණය | 116 |
| නිවාස උද්‍යාන | 78 |
| උද්‍යාන භූමි අලංකරණය | 141 |
| ශාක රෝග සහ ව්‍යාධි විද්‍යාව | 35 |
| සෙසු ශාක විශේෂ හඳුනා ගැනීම | 4 |
| **එකතුව** | **374** |

ඊට අමතරව උද්‍යාන භූමි අලංකරණය පිළිබඳව සයමාසික පුහුණු වැඩසටහන් 2 ක් හමුදා නිලධාරීන් සඳහා ද පුද්ගලයින් හත්දෙනෙකු සඳහා උද්‍යාන භූමි අලංකරණය පිළිබඳ ත්‍රෛමාසික පාඨමාලාවක් පවත්වන ලදී.

***උපදේශාත්මක වැඩසටහන්***

"සුන්දර ගම්පහ" වැඩසටහන යටතේ නගරය අලංකාර කිරීම සඳහා උපදෙස් සැපයීම සහ උද්‍යාන භූමි අලංකරණ ලක්ෂණ වැඩි දියුණු කරන ලදී. මෙම වැඩසටහන යටතේ හෙනරත්ගොඩ සංරක්ෂණ ව්‍යාපෘතිය, මීනුවන්ගොඩ , ජා - ඇල සහ මහර නගර සංවර්ධන ව්‍යාපෘති, දඬු ගං ඔය ව්‍යාපෘතිය, පිළිකුට්ටුව සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. කටුනායක අන්තර්ජාතික ගුවන්තොටුපොල ප්‍රදේශයහි උද්‍යාන භූමි අලංකරණය, ප්‍රාදේශීය ලේකම්වරුන්, ගම්පහ, මීනුවන්ගොඩ ගුවන් හමුදා කඳවුර සහ ජා-ඇල, ඒකල , වේයන්ගොඩ බණ්ඩාරනායක විද්‍යාලය, නයිවල උසස් තාක්ෂණ ආයතනය, ඔරුතොට පාරිසරික කලාපය සහ ගම්පහ යශෝධරා බාලිකා

- රුක් උයන
- වැව





විද්‍යාලය සඳහා තාක්ෂණික සහාය ලබාදෙන ලදී.

ප්‍රදේශයේ මල් වගාව පිළිබඳව ස්වයං රැකියා පුහුණු වැඩසටහන් කිහිපයක් තරුණ තරුණියින් සඳහා ක්‍රියාත්මක කරන ලදී .

ස්වයං රැකියාවල නියුතුවුවන් 421 ක් සඳහා ඇන්තුරියම් සහ විසිතුරු පැළ වගාව පිළිබඳව එක් දින වැඩමුළු 12 ක් පවත්වන ලදී.

**සංවර්ධන ක්‍රියාකාරකම්**

උද්‍යානයේ භූමි අලංකරණ ලක්ෂණ සහ මාර්ගවල ගුණාත්මකභාවය වැඩි කිරීම සඳහා උද්‍යානයේ අභ්‍යන්තර මාර්ග පද්ධතිය වැඩි දියුණු කරන ලදී.

උද්‍යානයේ පොලිතින් ගෘහ (30’x20’), අලුත්වැඩියාව සහ බඳුන් ගෘහය අලුත්වැඩියා කරන ලදී. ශාකවල මනා කලමනාකරණය සඳහා නව සෙවන ගෘහයක් ඉදිවෙමින් පවතී.

මනා උද්‍යාන භූමි අලංකරණ ලක්ෂණ සහිතව වැසිකිලි සංකීර්ණය අලුත්වැඩියා කරන ලදී.

උද්‍යාන අලංකාර කිරීම සඳහා නව යන්ත්‍ර සූත්‍ර, උපකරණ, මෙවලම් මිලදී ගන්නා ලදී.





⮝ නව පිවිසුම් දොරටුව

➢ පුහුණු වැඩසටහන් පවත්වාගෙන යාම

⮟ ප්‍රදේශයේ සංවර්ධනය සඳහා උපදේශාත්මක ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදී

⮟➢මායිම් බිත්තිය වැඩිදියුණු කිරීම





**කාර්ය මණ්ඩල තොරතුරු**

***2011 වර්ෂයේ පවතින තනතුරු පිළිබඳ තොරතුරු***

| | තනතුර | පවතින තනතුරු |
|---|---|---|
| 1. | උද්‍යාන පාලක | 01 |
| 2. | පර්යේෂණ නිලධාරි | 01 |
| 3. | කෘෂි උපදේශක | 06 |
| 4. | වැඩසටහන් සහකාර (කෘෂි.) | 06 |
| 5. | පර්යේෂණ සහකාර | 01 |
| 6. | රාජ්‍ය කළමනාකරණ සහකාර | 05 |
| 7. | ගාස්තු අයකිරීමේ සහකාර | 01 |
| 8. | රියදුරු | 01 |
| 9. | කාර්යාල කාර්ය සහායක | 01 |
| 10. | ට්‍රැක්ටර් ක්‍රියාකරු | 01 |
| 11. | තෘණ කපන යන්ත්‍ර ක්‍රියාකරු | 02 |
| 12. | බද්ධකරු | 01 |
| 13. | පැළතවාන්කරු | 01 |
| 14. | ස්ථිර කම්කරු | 20 |
| 15. | කොන්ත්‍රාත් කම්කරු | 19 |
| | **එකතුව** | **67** |

***මාරුවීම් සහ විශ්‍රාම ගැනීම්***

කළමනාකරණ සහකාර ජේ.එම්.ඩී. කුමාරි මෙය පේරාදෙනිය ප්‍රධාන කාර්යාලය වෙත මාරුවීමක් ලබන ලදී.
කළමනාකරණ සහකාර (III) සී.එස්. තේනුවර මිය උද්‍යානයෙන් පොලිස් මූලස්ථානය වෙත මාරුවීමක් ලබන ලදී.
වැඩසටහන් සහකාර ආර්.එම්. තක්ෂිලා මිය උද්‍යානයෙන් නැගෙනහිර පළාතේ ආණ්ඩුකාර කාර්යාලය වෙත මාරුවීමක් ලබන ලදී.
උද්‍යාන කම්කරු එම්.පී. ප්‍රියන්ත මුතුගල මහතා උද්‍යානයෙන් අරලියගහමැදුර උද්‍යානය වෙත මාරුවීමක් ලබන ලදී.

# වන ඖෂධ උද්‍යානය, ගනේවත්ත

කුරුණෑගල සිට මීටර් 15 ක් පමණ ඈතින් වයඹ පලාතේ ගනේවත්ත වන ඖෂධ උද්‍යානය පිහිටා ඇත. මෙවැනි ප්‍රදේශයක පිහිටා තිබීම හේතුවෙන් ඖෂධ පැළෑටි විශාල ප්‍රමාණයක් වගා කිරීම සඳහා ඉතා හොඳ පරිසරයක් මෙම උද්‍යානයේ ඇත. මෙය අක්කර 52 ක වපසරියකින් යුක්ත වන අතර, ඉන් භාගයක් පමණ පොල් වගාව සඳහා වෙන් වී ඇත. අක්කර 22 ක් ඖෂධ වගා කර ඇත.

මෙම උද්‍යානයේ ප්‍රධාන අරමුණ වන්නේ දුර්ලභ ඖෂධ පැළෑටි වර්ග සංරක්ෂණය කිරීම, ඖෂධ පැළෑටි ක්‍රමවත් වගා කිරීම් ක්‍රම පිළිබඳ , පැළෑටි එකතු කිරීමේ ක්‍රම සම්බන්ධ අධ්‍යයනයන් කිරීම හා ඖෂධ පැළෑටි පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම වේ. මීට අමතරව දුර්ලභ ඖෂධ පැළෑටි වර්ග පිළිබඳ පර්යේෂණ ද සිදු කෙරේ.



**උද්‍යානයේ ක්‍රියාත්මක වූ ක්‍රියාකාරකම්**

භූමි වැඩි දියුණු කිරීම, මාර්ග සංවර්ධනය, ගොඩනැගිලි සහ ව්‍යුහ කොටස් ඉදිකිරීම වැනි වැඩි දියුණු කිරීම් සිදු කරන ලද අතර, උද්‍යානය මනා සේ පවත්වාගෙන යන ලදී.

උද්‍යානයේ දර්ශනීය අලංකාරය වැඩි දියුණු කිරීමට උද්‍යානයේ සමහර කොටස්වල භූමි සංවර්ධන ක්‍රියාකාරකම් පවත්වාගෙන යන ලදී.

උද්‍යානයේ ගුණාත්මකභාවය සහ තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා අභ්‍යන්තර මාර්ග වැඩි දියුණු කරන ලදී. උද්‍යානයේ රෝපණ වැඩසටහන්වල මනා කළමනාකරණය සඳහා දැල් නිවාසයක් සහ පැළ ගෘහයක් ස්ථාපිත කරන ලදී.

උද්‍යානයේ රෝපණය කරන ලද සමහර වටිනා වෘක්ෂයන් ආරක්ෂා කිරීමට මායිම් වැටක් ඉදිකිරීම නිමා කර ඇති අතර පැරණි කාර්ය මණ්ඩල නිළ නිවාස මනා බාහිර පෙනුමක් ඇතිවන පරිදි අලුත්වැඩියා කරන ලදී.

රෝපණ වැඩසටහන කඩිනම් කළ අතර, ඉඟුරු *(Zingiber officinale)*, අරත්ත *(Alpinia calcarata)* වගා මෙන්ම ඉඟුරු වගාව අක්කර ¾ ප්‍රමාණයක වගා කිරීමෙන් වැඩි දියුණු කරන ලදී

ඖෂධ පැළෑටි එකතු කිරීම සඳහා අරංකැලේ වනයෙහි ක්ෂේත්‍ර ගවේෂණ චාරිකාවක් පවත්වාගෙන යන ලදී. ජාන ප්ලාස්ම එකතුව සහ ගනේවත්ත වන ඖෂධ උද්‍යානයේ ශාක එකතුව වැඩි දියුණු කරන ලදී.

**ශාක නිෂ්පාදනය සහ අලෙවිය**

මෙම වසරේදී පැළ අලෙවිසැලෙන් පැල 12,385 ක් විකුණන ලද අතර, 17,357 ක් නිෂ්පාදනය කරන ලදී. ඊට අමතර 16,658 ක් පොල් විකුණන ලදී.

ඖෂධ පැළෑටි, පොල් සහ සෙසු නිෂ්පාදන (වියළි නෙල්ලි, අඹ ආදිය)අලෙවියෙන් මෙම වසරේදී රුපියල් 705,204 ක ආදායමක් උපයා ගන්නා ලදී.

ඖෂධ පැළෑටි පිළිබඳ තොරතුරු ලබා ගැනිම සඳහා උද්‍යානය වෙත මිනිසුන් 900 පැමිණෙන ලදහ. ඖෂධ පැළෑටි සංරක්ෂණය සහ භාවිතය මෙන්ම පැළ මිලදී ගැනීමට සහ ඔවුන්ගේ අවශ්‍යතා අනුව ඖෂධ මිලදී ගැනිමට මිනිසුන් උද්‍යානය වෙත පැමිණෙන ලදහ.

ජපාන සිසුන් අටදෙනෙකු ඖෂධ පැළෑටි පිළිබඳ ව්‍යාපෘතියක් සඳහා අධ්‍යනයක නිරත වී සිටියහ.



- ➢ වැල් සමුහ
- ➢ ඉදිකරන ලද මායිම් වැට



**කාර්ය මණ්ඩල තොරතුරු**

***2011 වර්ෂයේ පවතින තනතුරු පිළිබඳ තොරතුරු***

| | **තනතුර** | **පවතින තනතුරු** |
|---|---|---|
| 1. | කෘෂිකර්ම උපදේශක | 01 |
| 2. | උද්‍යාන සහකාර | 01 |
| 3. | ගබඩාකරු | 01 |
| 4. | ස්ථිර කම්කරු | 07 |
| 5. | කොන්ත්‍රාත් කම්කරු | 06 |
| | **එකතුව** | **16** |

***මාරුවීම් සහ විශ්‍රාම ගැන්වීම්***

තෘණ කපන යන්ත්‍ර ක්‍රියාකරු පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය වෙත මාරුවීමක් ලබන ලදී.

## වියළි කලාපිය උද්භිද උද්‍යානය, හම්බන්තොට

දේශිය විශේෂඥයින්ගේ සැලසුම් අනුව අවු: 130 කට පසුව බිහිවූ ශ්‍රී ලංකාවේ ප්‍රථම උද්භිද උද්‍යානය වනුයේ වියළි කලාපිය උද්භිද උද්‍යානයයි. මෙම උද්‍යානය දකුණු පළාතේ හම්බන්තොට මිරිජ්ජවිල ප්‍රදේශයේ පිහිටා ඇති අතර, සංවර්ධන වැඩ කටයුතු 2006 වර්ෂයේ ආරම්භ වී ඇත.

විවිධ වූ මානව ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස වියළි කලාපීය කැලෑ වෘක්ෂලතා ඉතා ශීඝ්‍රයෙන් වැනසී ගොස් ඇති අතර පසුගිය වසර 30 ක කාලය තුළ හම්බන්තොට ප්‍රදේශයේ වියළි කලාපීය වෘක්ෂලතා 98% කින් වැනසි ගොස් ඇත. මෙම උද්‍යානය පිහිටුවීමේ ප්‍රධාන අරමුණු වනුයේ කෙටි කාලීන හා දිර්ඝ කාලීනව වියළි සහ ශුෂ්ක කලාපීය පැළෑටි සංරක්ෂණය කිරීම, වියළි කලාපයේ එතරම් නොදන්නා මෙන්ම මේ දක්වා භාවිත කොට නැති පැළෑටි වර්ග පිළිබඳව අධ්‍යයනය කිරීම, ඖෂධ කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම, ප්‍රදේශයේ ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම, වියළි කලාපයේ උද්භිද විද්‍යාව හා මල් වගාව පිළිබඳ අධ්‍යාපනය හා පුහුණුව ලබාදීම යන කටයුතු ය.



**2011 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම්**

මිර්ජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය ඉදිකිරීමේ කටයුතු නිමා කිරීම සඳහා සංවර්ධන ක්‍රියාකාරකම් පවත්වාගෙන යන ලදී. මෙම උද්‍යානය වියළි සහ ශුෂ්ක කලාපීය ශාක සංරක්ෂණය ආරම්භ කරන ලදී.

නිලධාරින්හට සහ දුර පලාත්වල සිට පැමිණෙන පුහුණු කණ්ඩායම් සඳහා පහසුකම් සැපයිමට නේවාසිගාරයක් ඉදි කරන ලදී. මහජනයාට පහසුකම් සැපයිම සඳහා ජාතික ජල සම්පාදන සහ ජලාපවාහන මණ්ඩලය මගින් පානීය ජල පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා මුල පුරන ලදී. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මගින් ප්‍රවේශ පත්‍ර කවුන්ටරය සහ වැසිකිළි සහිත ගිම්හාන කුටි 04 ක් සහිත වූ පිවිසුම් සංකිර්ණය ස්ථාපනය කිරීම සඳහා ටෙන්ඩර් කැඳවා ඇත

පිවිසුම් සංකිර්ණය වටා අලංකාර වැටක් සහ බංකු සකස් කරන ලදී .

නව ප්‍රදේශ සංවර්ධනය කරන ලදී. නව උද්‍යාන භූමි අලංකරණ ලක්ෂණ සහ ව්‍යුහ කොටස් එකතු කරන ලදී. උද්‍යානයේ භූමි සංවර්ධනය , අඩි පාරවල්, මාවත් සහ පඳුරු උයන , කැක්ටස් එකතුව වැනි උද්‍යාන භූමි අලංකරණ සංවර්ධන ක්‍රියාකාරකම් සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක වෙමින් පවති.

උද්‍යානය මහජනයා වෙත විවෘත කිරීමෙන් අනතුරුව දේශිය ජනතාව උදෙසා ඍජු රැකියා අවස්ථා 300 සහ වක්‍ර රැකියා අවස්ථා 1000 ක් සහ මල් වගාව අපනයනය, ජෛන්ද්‍රීය රෝපණය සහ ඖෂධ කර්මාන්තය පිළිබඳ ස්වයං රැකියා අවස්ථා ලබාදීමට අදහස් කර ඇත.

ප්‍රදේශයේ වගාකරුවන්හට පහසුකම් ලබාදිම සඳහා මල් වගා සංවර්ධන ක්‍රියාකාරකම් වැඩි දියුණු කර ඇත. රෝපණ වැඩසටහන් මගින් උද්‍යානයේ ශාක එකතුව වැඩි දියුණු කරන ලදී .



- මල් උද්‍යානය
- ප්‍රදේශයේ වගාකරුවන් සඳහා දැනුවත් කිරීමෙ වැඩසටහන් පවත්වාගෙන යාම
- නඩත්තු කරන ලද පැළ ඉනි වැටවල්
- අලුතින් ඉදිකරන ලද නේවාසිකාගාරය












රුක් උයන
ඕකිඩ් එකතුව
බෝගන්විලා එකතුව





අභ්‍යන්තර මාර්ග සංවර්ධනය

උද්‍යානයේ වැඩි දියුණු කරන උද්‍යාන භූමි අලංකරණ ලක්ෂණ



**කාර්ය මණ්ඩල තොරතුරු**

***2011 වර්ෂයේ පවතින තනතුරු පිළිබඳ තොරතුරු***

| | **තනතුර** | **පවතින තනතුරු** |
|---|---|---|
| 1. | වැඩසටහන් සහකාර (කෘෂි) | 2 |
| 2. | කෘෂිකර්ම උපදේශක | 1 |
| 3. | කළමනාකරණ සහකාර | 3 |
| 4. | රියදුරු | 1 |
| 5. | උද්‍යාන අධීක්ෂක | 1 |
| 6. | කොන්ත්‍රාත් කම්කරු | 70 |
| | **එකතුව** | **78** |

# තෙත් කලාපිය උද්භිද උද්‍යානය, අවිස්සාවේල්ල

උද්‍යානයේ වපසරිය අක්කර 62 ක් වන අතර, එය බස්නාහිර පළාතේ අවිස්සාවේල්ල ඉලුක්ඕවිට ප්‍රදේශයේ ඉලුක්ඕවිට ප්‍රාථමික පාසලට යාබදව පිහිටා ඇත. ප්‍රදේශයේ වඳවීමට ලක් වී ඇති මල් මෙම උද්‍යානය මගින් ඉතා හොඳින් සංරක්ෂණය කරනු ලබන අතර දිවයිනේ සංචාරක කර්මාන්තය හා මල් වගා ක්ෂේත්‍රය ඉහළ නැංවීමට කටයුතු කරමි. උද්භිද විද්‍යාව හා පරිසර විද්‍යාව හදාරන සිසුන් හා පර්යේෂකයන් සඳහා සුදුසු ප්‍රදේශයක් ලෙසත්, පුද්ගලයන් සඳහා විනෝදාස්වාදය ගෙන දෙන ප්‍රදේශයක් ලෙසත් මෙම උද්‍යානය එහි කාර්යයන් සිදු කරයි. මෙම උද්‍යානයේ ප්‍රධාන අරමුණ වන්නේ තෙත් පහත් බිම්වල ශෘක සම්බන්ධ විතැන් සංරක්ෂණය සිදු කිරිමයි.







- අභ්‍යන්තර මාර්ග සංවර්ධනය
- උද්‍යානයේ තෘණ බිම් සැකසීම
- කුඹුක් උද්‍යානය
- පොලිතීන් ගෘහවල වැඩෙනා ඕකිඩ්





**2011 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම්**

අවිස්සාවේල්ල ඉලුක්ඕවිට උද්භිද උද්‍යානය ඉදිකිරීමේ කටයුතු නිමා කිරීම සඳහා සංවර්ධන ක්‍රියාකාරකම් පවත්වාගෙන යන ලදී. මෙම උද්‍යානය පහතරට තෙත් කලාපීය ශාක සංරක්ෂණය ආරම්භ කරන ලදී.

දර්ශනීය අලංකාරය වැඩි දියුණු කිරීම සඳහා, භූමියෙහි දිගු කාලීන භාවිතය සඳහා භූමිය සැකසීම සහ උද්‍යාන භූමි අලංකරණ ලක්ෂණ ගොඩනැංවීම ක්‍රියාත්මක කරන ලදී.

සැලසුම් කළ පරිදි උද්‍යානයේ පිවිසුම් සංකීර්ණය, රථගාල සහ අඩි පාරවල් ස්ථාපිත කිරීම සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මඟින් ටෙන්ඩර් කැඳවා ඇත. රුක් උයන ස්ථාපනය කිරීම ක්‍රියාත්මක වෙමින් පවතී. රුක් උයනේ උතුරු කොටසේ අක්කර 25 භූමි ප්‍රමාණයක් එළිපෙහෙළි කරන ලදී. උද්‍යානයේ බාහිර පෙනුම වැඩි දියුණු කිරීම සඳහා අභ්‍යන්තර මාර්ග සංවර්ධනය ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදී.

තෙත් කලාපයේ කුඹුක් උද්‍යානය සඳහා ජල ධාරාවන් සැපයීම සඳහා කුඹුක් ප්‍රදේශයේ අලංකාර කිරීම සඳහා උද්‍යානය අසල වැවක් ස්ථාපිත කරන ලදී. වෙනත් වැවක් උද්‍යානයේ වගුරුබිම් සහිත ප්‍රදේශයේ මනා ලෙස ජලය ලබා ගැනීමටත් රෝපණ ක්‍රියාකාරකම් නඩත්තු කරමින් පවත්වාගෙන යාමටත් ඉදිවෙමින් පවති.

ප්‍රදේශයේ වගාකරුවන්හට පහසුකම් සැපයීම සඳහා මල්වගා සංවර්ධන ක්‍රියාකාරකම් වැඩි දියුණු කරන ලදී. රෝපණ වැඩසටහන් මඟින් උද්‍යානයේ ශාක එකතුව වැඩි දියුණු කරන ලදී.

පොලිතින් ගෘහවල ඇන්තූරියම් සහ ඕකිඩ් වගා කරන ලදී. මෙම වසර තුලදී නව ඕකිඩ් විශේෂ 600 ක් හඳුන්වාදෙන ලදී. අපනයන මල් වගාව, කාබනික වගාව සහ ඖෂධ කර්මාන්ත පිළිබඳ ස්වයං රැකියා ඇති කිරීම සහ ප්‍රදේශයේ ජනතාව සඳහා ඍජු රැකියා අවස්ථා 100 සහ වක්‍ර රැකියා අවස්ථා 1000 ඇති කිරීමට අපේක්ෂිතය.



➢ කුඹුක් උද්‍යානය අසල ඇති සංවර්ධනය වන වැව

➢ සංවර්ධනය කරන ලද වැව



**කාර්ය මණ්ඩල තොරතුරු**

***2011 වර්ෂයේ පවතින තනතුරු පිළිබඳ තොරතුරු***

| | **තත්ත්වය** | **පවතින තනතුරු** |
|---|---|---|
| 1. | වැඩසටහන් සහකාර (කෘෂි) | 1 |
| 2. | කෘෂිකර්ම උපදේශක | 1 |
| 3. | කම්කරුවන් (කොන්ත්‍රාත් පදනම මත) | 13 |
| | **එකතුව** | **15** |

# අතිගරු ජනාධිපතිතුමාගේ සහ අගමැතිතුමාගේ නිළ නිවාස උද්‍යාන

අතිගරු ජනාධිපතිතුමාගේ කොළඹ 01 පිහිටි අරලියගහ මන්දිරය, මහනුවර, නුවරඑළිය, අනුරාධපුරය, සහ ගරු අගමැතිතුමාගේ කොළඹ සහ නුවරඑළියේ පිහිටි නිළ නිවාසබද උද්‍යාන උසස් ලෙස නඩත්තු කරන ලදී .

අතිගරු ජනාධිපතිතුමාගේ සහ අතිගරු අගමැතිතුමාගේ නිළ නිවාසබද උද්‍යානවල අලංකාරය වැඩි කිරීම සඳහා සංවර්ධන කටයුතු දියත් කර ලදී.

මෙම උද්‍යානවල අභ්‍යන්තර අඩි පාරවල් වැඩිදියුණු කර ඇති අතර, සමහර අංශ ද වැඩි දියුණු කර ඇත. මල් තීරු, මල් පාත්ති සහ එළවළු පාත්ති එක් කිරීමෙන් සියළුම උද්‍යානවල භූමි අලංකරණය වැඩි දියුණු කර ඇත.

භූමි අලංකරණය හා උද්‍යානයේ භාවිතය සඳහා උපකරණ හා යන්ත්‍ර මිලදී ගන්නා ලදී.

මල්,එළවළු සහ පලතුරු පැල තවාන්වල සාර්ථක නඩත්තු කොට එදිනෙදා අවශ්‍යතා සඳහා මල්,එළවළු සහ පලතුරු සපයනු ලැබේ.





- ⮙ අතිගරු අගැමැතිතුමාගේ නිල නිවාස උද්‍යානයේ මල් පාත්ති
- ➢ ⮛අරලියගහ මැදුර උද්‍යානයේ වැවෙන එළවළු

අතිගරු අගමැතිතුමාගේ නිල නිවස උද්‍යානයේ ශාක ලේබල් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක වූ අතර එය මෙම වසර තුලදී සාර්ථකව නිමාවෙන ලදී.



# පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් ඒකක

කොළඹ ,නාරාහේන්පිට උද්‍යාන සහායක කාර්යාලයෙන් මහනුවර, ජාවත්ත, බොරැල්ල, සහ ත්‍රිකුණාමලය පිහිටි පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් ඒකක උසස් මට්ටමකින් නඩත්තු වේ.

බොරැල්ල යුධ සොහොන් ඒකකයේ අලංකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා සොහොනෙහි මුදුන් ගල ගොඩනංවන ලදී

වල් ඌරන්ගෙන් සිදුවන හානියෙන් මග හැරිම සඳහා මහනුවර යුධ සොහොන් ඒකකය වටා වැටක් ස්ථාපිත කර ඇත.

*Paspalum vaginatum*, තෘන වැවීමෙන් ත්‍රිකුණාමලය යුධ සොහොන් ඒකකයේ පිට්ටනිය නැවත සකස් කරන ලදී.

නුවරඑළිය යුධ සොහොන් පිහිටි ත්‍රිත්ව පල්ලියට යාව පිහිටි මීදුලේ නව මුදුන් ගල් පිහිටුවන ලදී. මධ්‍යම පළාත් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ කාර්යාලය මගින් සංවිධානය කරන ලදී. උද්‍යාන යටතේ නාගරික ප්‍රදේශවල පොදු ස්ථානවල භූමි සංවර්ධන කිරීමේ තරග මාලාවන් මහනුවර යුධ සොහොන් ඒකකය දෙවනි ස්ථානය හිමි කර ගන්නා ලදී.






- මහනුවර යුධ සොහොන් ඒකක
- මහනුවර යුධ සොහොන් ඒකකයේ වැට කෙළින් කිරීම
- මහනුවර යුධ සොහොන් ඒකකය දිනාගන්නා ලද සම්මාන







- ත්‍රිකුණාමලය යුධ සොහොන් ඒකකය
- ජාවත්ත යුධ සොහොන් ඒකකය

**2011 වර්ෂයේදී ප්‍රකාශයට පත් කරන ලද පර්යේෂණ පත්‍ර**


1. Wjesundara, D.S.A. (2011). The peak wilderness. Pages 107-121 in Sarala Fernando editor. Sri Pada – Peak Heritage of Lanka. Sarala Fernando and Luxshmanan Nadaraja Publishers, Colombo. 227 pp.

2. Wijesundara, D.S.A. (2011) Anti-inflammatory Plants Used in Sri Lanka. Proceedings of IFS – AFASSA International Symposium on Natural Products and their Applications in Health and Agriculture. Institute of Fundamental studies, Kandy.

3. Amaras inghe, A. P. P. R. & D. S. A. Wi jesundara (2011) A new species of *Rhinacanthus* (Acanthaceae) from Sri Lanka. Edinburgh Journal of Botany 68 (3): 333–337

4. Miththapala, S., S. Wijesundara and J. galappatti (2011). Flowering plants commonly encountered in Sri Lankam habitats. National Trust: Colombo. 216 pp.

5. B. Marambe, P. Silva, S. Ranwala, J. Gunawardena, D. Weerakoon, S. Wijesundara, L. Manawadu, N. Atapattu, and M. Kurukulasuriya (2011) Invasive alien fauna in Sri Lanka: National list, impacts and regulatory framework. In: Veitch, C. R.; Clout, M. N. and Towns, D. R. (eds.).. Island invasives: eradication and management. IUCN, Gland, Switzerland. 445-450

6. Mikhail S. Romanov, Alexey V. F. Ch. Bobrov, D. Siril A. Wijesundara and Ekaterina S. Romanova. (2011) Pericarp development and fruit structure in borassoid palms (Arecaceae–Coryphoideae–Borasseae) Annals of Botany (first published online August 10, 2011 doi:10.1093/aob/mcr148)

7. R. H. G. Ranil, D. K. N. G. Pushpakumara, T. Janssen, C. R. Fraser-Jenkins and D. S. A. Wijesundara (2011) Conservation Priorities for Tree Ferns (Cyatheaceae) in Sri Lanka. Taiwania, 56(3): 201-209.


Following research publications were made available on floriculture for use of stakeholders involve in floriculture industry.

1. Investigation of a Suitable Growing Medium and Fertilizer Package for *Dracaena godseffiana L. cv* “Florida Beauty” (C. H Sapumanage, R. A. S. Perera and S. E Peiris)
2. Effect of BAP & IAA on Sucker Formation of *Chlorophytum comosum* **(**T.M.H.D. Tennekoon, S. E.Peris, S. A. Krishnarajah)
3. Selection of Suitable Growing Media for Growth of Commercial Dendrobium (W.M.D.N. Warigajeshta, W.M.D.E.R. Andradi, S.A Krishnarajah and D.S.A. Wijesundara)
4. Effect of $GA_3$ (Gibberellic acid) in combination with BAP (Benzyle Adenine Purine) on lateral shoot induction of topped *Anthurium andraeanum* in vivo (G. R. C. N. K. Godigamuwa, P. K. Dissanayake and S. A. Krishnarajah)
5. Effect of BAP (Benzyle amino Purine) and IAA (Indole acetic acid) on the growth of *Ophiophogan Japonicus* (ornamental foliage) (H. E. Herath, S. A. Krishnarajah and J. W. Damunupola)

**2012 ක්‍රියාකාරි සැලැස්ම**

| මහින්ද චින්තන වැඩසටහන | සැලැසුම් කරන ලද ක්‍රියාකාරකම් |
|---|---|
| පාරිසරික සංරක්ෂණය සහ පරිසර හිතකාමී සංචාරක ප්‍රවර්ධනය සඳහා දිගු කාලීන ප්‍රතිපත්තියක් | පහතරට වියළි කළාපීය ශාක සංරක්ෂණය කිරීම සඳහා ආරම්භ කරන ලද මිරිජ්ජවිල උද්භිද උද්‍යානයේ සංවර්ධන කටයුතු දිගටම පවත්වාගෙන යාම:<br>1. නරඹන්නන්හට පහසුකම් ලබා දීම සඳහා , ප්‍රධාන පිවිසුම් සංකීර්ණය, රථගාල, උයන් කුටි සහ වැසිකිළි, පානීය ජල ක්‍රමය ඉදිකිරීම අවසන් කර ඇත.<br>2. මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම.<br>3. ප්‍රදේශයේ වටා වචන්නන්හට පහසුකම් සැපයීම සඳහා මල්වගා තවාන් සංවර්ධනය ක්‍රියාකාරකම් පවත්වන ලදී. පාසැල් ළමුන් ඇතුළු මහජනයා සඳහා පුහුණු වැඩසටහන් පවත්වා ඇත.<br>4. පැළ සිටුවීම සහ ශාක සංරක්ෂණ වැඩසටහන්.<br>5. භූමි අලංකරණ සංවර්ධන වැඩසටහන්.<br><br>පහතරට තෙත් කලාපීය ශාක සංරක්ෂණය කිරීම සඳහා ආරම්භ කරන ලද අවිස්සාවේල්ල ඉලුක්ඔවිට උද්භිද උද්‍යානයේ සංවර්ධන කටයුතු දිගටම පවත්වාගෙන යාම:<br>1. අමුත්තන් මධ්‍යස්ථ ගත කරමින් ප්‍රධාන පිවිසුම් සංකීර්ණය ඉදිකිරීම අවසන් කර ඇත.<br>2. අභ්‍යන්තර මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම.<br>3. උද්‍යානයේ භූමි අලංකරණ ලක්ෂණ වැඩි කිරීම සඳහා භූමි සංවර්ධන ක්‍රියාකාරකම් පවත්වාගෙන ගොස් ඇත.<br>4. ශාක එකතුව සමූහය වැඩි කිරීම සඳහා ශාක වැඩසටහන් පවත්වා ඇත.<br>5. ප්‍රදේශයේ වචන්නන්හට පහුසකම් සැපයීම සඳහා උද්‍යානයේ මල්වගා සංවර්ධන ක්‍රියාකාරකම් සංවර්ධනය කර ඇත. |
| ජෛව විවිධත්ව සංරක්ෂණය තහවුරු කිරීම | 1. ලයිකන්, බීයෝශාකීය වැනි පහත් ශාක පිළිබඳ අධ්‍යයනය දිගටම පවත්වාගෙන යාම.<br>2. ශ්‍රී ලංකාවේ ශාක පිළිබඳ විතැන් සංරක්ෂණය<br>3. ඉඟුරු, අරත්ත .... වැනි ඖෂධ පැළෑටි වාණිජමය නිෂ්පාදනය සඳහා දියුණු කිරීම.<br>4. ගවේෂණය, ශාක නිදර්ශක එකතුව, වියළි සහ තෙත් කලාපීය ප්‍රධාන වශයෙන් තර්ජණයට පත්වූ ශාක සඳහා උද්භිද විද්‍යාත්මක සමීක්ෂණයක් පැවැත්වීම.<br>5. ශාක වර්ගීකරණය, විවිධත්වය හා සෙසු ආශ්‍රිත ප්‍රදේශවල විද්‍යාත්මක අධ්‍යයනය සහ පර්යේෂණ පවත්වාගෙන යාම.<br>6. ඓතිහාසික හෝ ආගමික වැදගත්කමකින් යුතු වෘක්ෂ සංරක්ෂණය කිරීම දිගටම පවත්වාගෙන යාම.<br>7. සෑම උද්භිද උද්‍යානයකින් අවම වශයෙන් ක්ෂේත්‍ර ගවේෂණ 10 ක් පවත්වාගෙන යාම.<br>8. ශාකාගාර නිදර්ශක පරිගණක ගත කිරීම.<br>9. ශ්‍රී ලංකාවේ ශාක වල ව්‍යුහාත්මක විමර්ශනය.<br>10. ශ්‍රී ලංකාවේ දුර්ලභ සහ තර්ජනයට ලක්ව ඇති ශාක වල ක්ෂුද්‍ර ප්‍රචාරණය පිළිබඳව පර්යේෂණ ආරම්භ කිරීම. |
| මල් වගාවේ යෙදෙන්නන්හට අත්‍යවශ්‍ය තාක්ෂණික සහ අනෙකුත් හැකියාවන්ගෙන් සන්නද්ධ කිරීම | 1. මල්වගා සංවර්ධනය සඳහා අදාල පර්යේෂණ වැඩසටහන් පවත්වාගෙන යාම<br>2. මල් වගාව සංවර්ධනය පිළිබඳ වචන්නන් ගේ හැකියාව වැඩි කිරීමට පුහුණු වැඩසටහන් පවත්වාගෙන යාම |

| | |
|---|---|
| | 3. මල් වගාව වවන්නන්ගේ අලෙවි හැකියාව වැඩි කිරීම සඳහා ප්‍රදර්ශන සංවිධානය කිරීම<br>4. වවන්නන්හට අලුත් වර්ගවල උසස් ගුණයෙන් යුත් මව් ශාක නිෂ්පාදනය කිරීමට සහ වටිනාකමින් යුත් නිෂ්පාදන පිළිබඳව හඳුන්වා දිම<br>5. “ සුවහස් මල් වැඩසටහන” යටතේ වවන්නන්ගේ පැළ තවාන්වලට ගොස් මෙහෙයුම් සහ කේෂ්ත්‍රයේදී ඔවුන්ට පැන නඟිනා ගැටළුවලට කේෂ්ත්‍ර උපදෙස් ලබා දීම<br>6. උද්භිද උද්‍යානවල බාහිරව ද මල් වගාව, පරිසර සංරක්ෂණය පිළිබඳ ප්‍රදර්ශන පැවැත්විම<br>7. මල් වගාව හා උද්‍යාන භූමි අලංකරණය පිළිබඳ අත් පත්‍රිකා ප්‍රකාශයට පත් කිරීම හා රූපවාහිනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>8. මල් වගා වවන්නන් අතර මල්වගා ගොවි සමිති සංවිධානය කිරීම.<br>9. රටෙහි මල්වගා කර්මාන්තය නගා සිටුවාලීම සඳහා මල්වගා ප්‍රවර්ධන වැඩසටහන් පවත්වාගෙන යාම.<br>10. කොළඹ වැදගත් ස්ථානවල කැපු මල් අලෙවිය ස්ථාපිත කිරීම.<br>11. ශාක වර්ගීකරණය සහ සංරක්ෂණය, ජෛව විවිධත්වය සහ අනෙකුත් ආශ්‍රිත ප්‍රදේශවල අධ්‍යාපන/පුහුණු වැඩසටහන් හා වැඩමුළු ක්‍රියාත්මක කිරීම. |
| විභවයක් ඇති විසිතුරු ශාක පිළිබඳව දිගුකාලීන හා කෙටි කාලීන පර්යේෂණ වැඩසටහන් ආරම්භ කිරීම. | 1. නව වර්ගවල ගවේෂණය මෙන්ම හඳුන්වාදීම සහ විභවයක් ඇති වන නිදර්ශක රටෙහි සහයෝගිත්වයෙන් ජාතික තලයට ගෙන ඒම.<br>2. ශිෂ්‍ය විද්‍යාවේ පර්යේෂණ සහ සංවර්ධනය සහ අනෙකුත් නව සොයා ගැනීම සහිත ශාක මෙන්ම පොදුවේ අලංකාරවත් ලෙස වැවෙනා ශාක වර්ගවල අනෙකුත් අගයන් ජෛව විද්‍යාත්මක පොහොරවල මල් වගා බෝග සඳහා අනුමැතිය.<br>3. මල්වගා බෝගවල පූර්ව සහ පශ්වාත් අස්වනු කළමනාකරණය පිළිබඳ පර්යේෂණ.<br>4. ජෛව තාක්ෂණය සහ පටක රෝපණය පිළිබඳ පර්යේෂණ පවත්වාගෙන යාම.<br>5. මල්වගාමය විභවයක් ඇති ජලජ ශාකවල පර්යේෂණ පැවැත්වීම.<br>6. පලිබෝධ සහ රෝග පිළිබඳ පර්යේෂණ.<br>7. මල් ප්‍රේරණ ක්‍රමවේද පිළිබඳ පර්යේෂණ. |
| ජිවනෝපාය නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 1. මල් වගාව සහ භූමි අලංකරණය පිළිබඳ තරුණ තරුණියන් සඳහා ත්‍රෛමාසික, එක් අවුරුදු, දැවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවන් ලබා දීම.<br>2. මල්වගාව, උද්‍යාන බෝග වගාව සහ ශාක සංරක්ෂණය පිළිබඳ උපදේශක සේවාවන සැපයිම. |